## උතුරු පළාත් සභාව - 2014

උතුරු පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (1SSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ

වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් උතුරු පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**(i) පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන**

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 2.2.2 අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

(අ) 2015 මාර්තු 31 දිනට සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් වර්ගය | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද ගිණුම් සංඛ්‍යාව | 2015 මාර්තු 31 දිනට ඉදිරිපත් නොකරන ලද ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 36 | 36 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 36 | 33 | 03 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 04 | 03 | 01 |
| (v) | අරමුදල් ගිණුම් | 01 | 01 | - |
| | | 78 | 74 | 04 |

(ආ) 2013 හා 2014 වර්ෂ සඳහා උතුරු පළාතේ ආදායම් ගිණුම පිළිබඳ ඒකාබද්ධ හිඟ ශේෂයන් පළාත් මුදල් රීති 145 ප්‍රකාරව 2015 සැප්තැම්බර් 30 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) එක් එක් ආදායම් ශීර්ෂ සඳහා ආදායම් ගිණුම් වෙනම පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2.2 විසර්ජන ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හෝ කොටසක් උපයෝජනය නොකිරීම , වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම, හිඟ බැරකම් ගිණුම්වලින් අත්හැරීම්, පුනරාවර්තන වියදම් මූලධන වියදම්වලට අය කිරීම මෙන්ම මූලධන වියදම් පුනරාවර්තන වියදම්වලට අය කිරීම , මූලධන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම, ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් හා සතුටුදායක පැහැදිලි කිරීම් නොවීම හා දෙපාර්තමේන්තු පොත් පළාත් භාණ්ඩාගාර පොත් සමඟ නොසැසඳීම වැනි නැවත නැවත සිදු වී තිබුණු පොදු අඩුපාඩු පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාළව සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිබඳ විසර්ජන ගිණුම් විගණනයේදී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) තත්කාර්ය පදනම මත වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් විවිධ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වැය විෂය සංකේත කිහිපයක් යටතේ සලසන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හෝ කොටසක් උපයෝජනය කර නොතිබුණි.

(ii) විසර්ජන ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා දී තිබූ පළාත් භාණ්ඩාගාර උපදෙස් සමඟ අනුකූල වී නොතිබුණි.

(iii) දුරකථන බිල්පත්, තැපැල් ගාස්තු ඉන්ධන, විදුලි වියදම් ආදිය සම්බන්ධයෙන් රු.83,361,186 ක් වූ බැරකම් සඳහා ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තු 3 ක විෂයයන් 13 කට අදාළව දැක්වෙන එකතුව රු.15,589,699 ක් වූ පාඩු සම්බන්ධයෙන් වර්ෂ 10 කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.

(v) නව වැය විෂය සංකේත ඇති කිරීමෙන් තොරව වැය විෂය ශීර්ෂ 28 ක් යටතේ රු. 461,847,051 ක් වූ වියදම් දරා තිබුණි.

(vi) විවිධ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් වලට අදාළ විෂයයන් 135 ක් යටතේ දරන ලද රු. 11,817,968 ක් වූ ප්‍රාග්ධන වියදම පුනරාවර්තන වියදම යටතේ සාවද්‍යාව වර්ගීකරණය කර තිබුණි.

(vii) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, වත්කම් විශාල සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂය තුළ අස්ථානගත වූ ලෙස වාර්තා කර තිබුණි. එහෙත් බොහෝ දෙපාර්තමේන්තු විසින් මෙම පාඩු එම විසර්ජන ගිණුම්වල ඇතුළත් කර නොතිබූ අතර පළාත් මුදල් රීති 69 ප්‍රකාරව පාඩු පිළිබඳ ප්‍රාරම්භක වාර්තා හා අවසාන වාර්තා එම දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(viii) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, විෂයයන් 16 ක් නැති වී තිබුණි. කෙසේ වුවද එක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 03 ක් විසින් එම පාඩු විසර්ජන ගිණුම්වල හෙළිදරව් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.3 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශනවල රු.3,792,174 ක් වූ හඳුනා නොගත් ශේෂ ඇතුළත්ව තිබුණි.

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශනවල රු.1,371,875 ක් වූ ගැලපුම් කළ ශේෂ ඇතුළත්ව තිබුණි.

(iii) යාපනය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශනවල රු.3,792,174 ක් වූ කිලිනොච්චි හා මුලතිව් හි හිඟ ශේෂයන් ඇතුළත්ව තිබුණි.

(iv) හර ශේෂ සඳහා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකළ බැවින් නිරවුල් නොකළ ණය වලට අදාළව අමාත්‍යාංශ 04 කින් සහ දෙපාර්තමේන්තු 19 කින් ලැබිය යුතු ලෙස දැක්වෙන රු.28,000,309 ක හර ශේෂයෙන් තථ්‍ය උපලබ්ධි මුදල නිරූපනය වන්නේද යන්න තහවුරු කළ නොහැකි විය.

### 2.2.4 වාණිජ අත්තිකාරම් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.212,349,022 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යන්ත්‍රෝපකරණ ඒකකය විසින් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ස්ථාවර වත්කම් ලේඛනය හා ලැබීම් ඇනවුම් ආදී කිසිදු ආධාරක ලියකියවිලි නොමැතිව යන්ත්‍රෝපකරණ ඒකකය විසින් රු.212,349,022 ක් වටිනා දායක ප්‍රාග්ධනය ගිණුම්ගත කර තිබුණි.

(iii) ගොවිපොළවල් 2 ක රු.175,244,729 ක් වූ ස්ථාවර වත්කම් දායක ප්‍රාග්ධනයේ සමාන මුදලකින් නියෝජනය වී නොතිබුණි.

(iv) ගව ආහාර හා කුකුල් ආහාර (mash) වෙළඳපොල මිලට වඩා වැඩි මිලකට මිලදී ගෙන තිබූ හෙයින් රු.80,510 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) පළාත් සභාවේ ක්‍රියාත්මක වන අත්තිකාරම් ගිණුම් කටයුතු 4 කින් අත්තිකාරම් ගිණුම් කටයුතු 3 ක ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(vi) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් පරිත්‍යාග කරන ලද වාහන 3 ක් වවුනියා, රජයේ බීජ නිෂ්පාදන ගොවිපොළ විසින් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(vii) වවුනියා, රජයේ බීජ නිෂ්පාදන ගොවිපොළ විසින් රු.104,102 ක් වූ හිඟ වරිපනම් බදු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(viii) වවුනියා, රජයේ බීජ නිෂ්පාදන ගොවිපොළ විසින් පැපොල් ගස්, දෙහි ගස් හා වෙනත් පැල වලින් උපයන ලද ආදායම අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ix) කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පේෂ කර්මාන්ත, කොහු හා මැටි භාණ්ඩවලින් උපයන ලද ආදායම අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

### 2.2.5 අග්‍රිම ගිණුම්

-------------

(i) එකතුව රු.5,855,800 ක්වූ අග්‍රිම ශේෂ 2015 අගෝස්තු 31 දක්වා පළාත් පාලන දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නිරවුල් නොකර පැවතුණි. මේ සම්බන්ධයෙන් අදාළ ආයතනවලින් හිඟ අග්‍රිමය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අග්‍රිම ශේෂ නිරවුල් නොකිරීමට හේතු විසර්ජන ගිණුමේ සටහන් (iii) හි දක්වා නොතිබුණි.

### 2.2.6 පොදු තැන්පත් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් එක් එක් අර්ධ වර්ෂයක් අවසානයේ පිළියෙල කර නොතිබුණි.

(ii) නොගෙවූ වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම දායකය, උපලබ්ධි නොවූ චෙක්පත්, රක්ෂණ හිමිකම්, බැංකු ප්‍රේෂණ, ණය අයකර ගැනීම්, දඩ මුදල් හා නොගෙවූ නිවාස කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.685,562 ක මුදලක් ඒ පිළිබඳ කටයුතු කිරීමෙන් තොරව අමාත්‍යාංශ 2 ක හා දෙපාර්තමේන්තු 5 ක තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(iii) රු.1,979,364 ක්වූ උපයන විට ගෙවීම් බදු, මුද්දර ගාස්තු හා එකතු කළ අගය මත බදු අදාළ ආයතනයන්ට ප්‍රේෂණය කිරීමෙන් තොරව දෙපාර්තමේන්තු 2 ක තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(iv) අමාත්‍යාංශ 2 ක් හා දෙපාර්තමේන්තු 14 ක් වෙතින් විවිධ කාර්යයන් සඳහා ලැබී තිබුණු එකතුව රු.133,725,218 ක්වූ අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(v) රඳවා ගැනීම් මුදල් හා අමාත්‍යාංශ 2 ක හා දෙපාර්තමේන්තු 6 ක ඉංග්‍රීසි ඩිප්ලෝමාව සඳහා පුද්ගලික තැන්පතු සහ ව්‍යාපෘති අරමුදල් එකතුව රු.14,527,719 ක් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(vi) රු.මිලියන 7.5 ක මුදලක් වර්ෂ 03 කට වැඩි කාලයක් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ තබා තිබුණි. කෙසේ වුවද ඉඩම් අයිතිකරු විසින් ඇයගේ

දේපල පළාත් සභාවට විකිණීමට අකමැති වූ හෙයින් එම ඉඩමේ වටිනාකම 2013 පෙබරවාරි 22 දින ප්‍රධාන ලේකම්ගේ තැන්පතු ගිණුමට මාරුකර තිබුණි.

(vii) දෙපාර්තමේන්තු තුනක රු.715,450 ක්වූ ටෙන්ඩර් තැන්පතු මාස 6 කට වැඩිකාලයක් ක්‍රියා මාර්ගයක් ගැනීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(viii) මුලතිව්, පළාත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අදාළව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත්වල අවසාන ශේෂයන් අතර වූ රු.503,782 ක වෙනස පිළිබඳ පැහැදිලි කර නොතිබුණි.

(ix) පළාත් මුදල් රෙගුලාසි 162 ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව එක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 5 ක් විසින් එකතුව රු.348,854,926 ක් වූ මුදල් පොදු තැන්පතු ගිණුමට මාරු කර තිබුණි.

**2.2.7 ගිණුම්කරණ අඩුපාඩු**

අමාත්‍යාංශ 5 ක හා දෙපාර්තමේන්තු 28 ක විසර්ජන ගිණුම්වල දැක්වෙන එකතුව රු.මිලියන 5,108.58 ක්වූ වත්කම් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

**2.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(i) ලැබිය යුතු ගිණුම්

(අ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් වෙනත් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේතුවලට මාරු වී ගිය විශ්‍රාම ගිය, මිය ගිය, ව්‍යාපෘතිවලට මුදාහරින ලද, වැටුප් රහිත නිවාඩු මත විදේශගත වූ, සේවය හැරගිය හා වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.33,195,148 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් පහක පළාත් පාලන ආයතන 34 ක මූල්‍ය ප්‍රකාශනවල 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.51,939,866 ක මුදලක් ලැබිය යුතු ගිණුම් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමෙන් තොරව පැවතුණු එකතුව රු. 5,312,585 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන යන්ත්‍රෝපකරණ ඒකකය විසින් කටයුතු කර නොතිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම්

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අදාළව දෙපාර්තමේන්තු 8 කට නිරවුල් කළ යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.5,715,270 ක් වූ බැර ශේෂයෙන් තථ්‍ය උපලබ්ධි මුදල නිරූපනය වන්නේද යන්න, බැර ශේෂයන් සඳහා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකළ බැවින් විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් 5 ක පළාත් පාලන ආයතන 34 ක මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණය හිමියන් ලෙස එකතුව රු.334,934,251 ක මුදලක් දක්වා තිබුණි.

### 2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

(i) බිල්පත්, ලදුපත්, යාන්ත්‍රික ඉංජිනේරු සහතික, භාණ්ඩ ලැබීම් පත්, සහභාගී වූ අයගේ ලැයිස්තු, ලබන්නාගේ අත්සන්, මුදල් ලදුපත්, මුල් බිල්පත්‍ර, ඉන්වොයිසි, ඉන්වෙන්ට්‍රි සහතික, වැඩ නිම කිරීම් සහතික ආදී අවශ්‍ය සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු.674,435,063 ක්වූ අමාත්‍යාංශ 5 ක් හා දෙපාර්තමේන්තු 28 කට අදාළව ගිණුම්වල දැක්වෙන විෂයයන් 2,162 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) ආයතන 04 කට අදාළ එකතුව රු.18,447,359 ක්වූ අත්තිකාරම් ගිණුම් කටයුතු ගිණුම්වල විෂයයන් 59 ක් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම

(අ) පෙර වර්ෂය තුළදී වරප්‍රසාද අඩු ළමුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් වෙනුවෙන් දිස්ත්‍රික් පහක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා පළාත් භාණ්ඩාගාරය විසින් රු.මිලියන 27.5 ක මුදලක් ආරක්ෂක සේනාංක මූලස්ථානයට මුදා හැර තිබුණි. කෙසේ වුවද වරප්‍රසාද අඩු ළමුන් සඳහා සංවර්ධන වැඩසටහන විසින් කරන ලද අරමුදල් උපයෝජනය සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන් ව නැවත පදිංචි කරන ලද පුද්ගලයන් සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතිය සඳහා 2014 ජනවාරි මාසයේදී රු.25,470,000 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද කොම්බයින් හාවස්ටර්ස් 6 කට අදාළව ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර ලබාගත නොහැකි විය.

(ඇ) රු.මිලියන 149.68 ක පිරිවැයකට පවත්වන ලද වැඩමුළු හා සම්මන්ත්‍රණ කිහිපයක් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් කැඳ වූ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) නීති උපදේශක පත්කිරීම සම්බන්ධයෙන් පත්කිරීමේ පදනම, රාජකාරී ලැයිස්තු, මාසික ගෙවීම, කරන ලද උපදේශක කාර්යයන්, පැමිණීම හා බඳවා ගැනීම් දිනය ආදී තොරතුරු විගණනය සඳහා කැඳ වූ නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් පහක පළාත් පාලන ආයතන 34 ක් සම්බන්ධයෙන් විගණනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රු.1,289,880,842 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ඊ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුළදී පළාත් සභාවට අයත් වාහන කිහිපයක් අනතුරුවලට භාජනය වී තිබූ අතර තොරතුරු කැඳවා තිබුණද එම අනතුරු පිළිබඳ තොරතුරු හා වෙනත් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අනුයුක්ත කරන ලද වාහන විස්තර හා ඉන්ධන සහ වාහන නඩත්තුව පිළිබඳ දරන ලද වියදම පිළිබඳ විස්තර විගණනයට කැඳවා තිබූ නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) පත්කිරීම්, අන්තර්ග්‍රහණය කිරීම්, ස්ථිර කිරීම්, මාරු කිරීම් හා කොන්ත්‍රාත් පත්කිරීම් කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකර තිබුණි. කෙසේ වුවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටු රැස්වීම් සටහන් විගණන පරීක්ෂණය සඳහා ඉල්ලා සිටියද ඉදිරිපත් කර නොතිබුණි.

(එ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර කැඳවා තිබුණද, විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 3.76 ක් වූ සරම්, තුවා, එක්සයිස් පොත් හා ඇඳ ඇතිරිලි සපයන ලද ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) පිළිතුරු නොසපයන ලද විගණන විමසුම්

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 12 කට පිළිතුරු 2015 අගෝස්තු 31 දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර එම විගණන විමසුම්වලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් ගණනය කළ හැකි වටිනාකම රු.153,645,331 ක් විය.
විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විගණන විමසුම් සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| | | රු. |
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | 03 | 63,878,435 |
| පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 | 291,420 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 04 | 49,391,003 |
| පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 02 | 21,731,764 |
| පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 02 | 18,352,709 |
| | 12 | 153,645,331 |

## 2.2.10 නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

(i) විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහය | | | |
| | (i) | XIV පරිච්ඡේදයේ 1.3 වගන්තිය | 103,186 | ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් හෝටල් ගාස්තු පළාත් අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් රාජකාරී හෝ පුද්ගලික ගමනක්ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාක්ෂි ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයෙන් ලබා ගත නොහැකි විය. |
| | (ii) | XLVII පරිච්ඡේදයේ 2.1 වගන්තිය | 9,000 | ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රතු වයින් මිලදී ගෙන තිබුණි. |
| (ආ) | උතුරු පළාත් මුල්‍ය රීති | | | |
| | (i) | පළාත් මුදල් රීති 106 | 12,360,470 | අදාළ අධිකාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අමාත්‍යාංශ දෙකක් හා දෙපාර්තමේන්තු 7 ක් විසින් ගෙවීම් සිදුකර තිබුණි. |
| | (ii) | පළාත් මුදල් රීති 107 | 1,261,351 | දෙපාර්තමේන්තු 4 ක රු.1,261,351 ක් වූ ගෙවීම් සහතික කිරීමේ නිලධාරීන් විසින් සහතික කර නොතිබුණි. |
| | (iii) | පළාත් මුදල් රීති 166 | 335,416 | පළාත් සභා ලේකම් කාර්යාලය හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ ඒකකය විසින් පසුගිය වර්ෂයේ දරන ලද රු.335,416 ක වියදම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සිදුකර තිබුණි. |
| | (iv) | පළාත් මුදල් රීති 187.2 (2) | 75,000 | කිලිනොච්චි කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) | පළාත් මුදල් රීති 415 (1) | - | බොහෝ දෙපාර්තමේන්තු විසින් දුරකථන ලේඛනය සහ දුරකථන ඇමතුම් ලේඛනය පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (vi) | පළාත් මුදල් රීති 420 (1)(v)(xiii) | 8,467,600 | අමාත්‍යාංශ 2 ක් හා දෙපාර්තමේන්තු 5 ක් විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලබාගැනීමෙන් තොරව කාර්යාල ගොඩනැගිලි සඳහා මාසික කුලී ගෙවා තිබුණි. |
| (vii) | පළාත් මුදල් රීති 420 (1)(x) | 510,000 | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නියමිත සීමා ඉක්මවා කාර්යාල ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම සිදුකර තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් පාඩු හා හානි ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 137 | 121,370 | උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) ගෙවීම් වවුචර් 3 ක් අනුමත කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 138 | 119,893,181 | උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) ගෙවීම් වවුචර් 7 ක් සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 214 | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 510 | 1,286,038 | සමාලෝචිත වර්ෂය සඳහා පශු සම්පත් ගොවිපොළ හා යන්ත්‍රෝපකරණ ඒකකයේ ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 1646 හා 1647 | - | බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දෛනික ධාවන සටහන් විධිමත්ව පවත්වා නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | - | (i) | වාහනවල ඉන්ධන පරිභෝජනය සෑම මාස 6 කට වරක් පරීක්ෂා කර ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. |
| | | | (ii) | අලුත්වැඩියා සඳහා ගෙවීම් කිරීමට පෙර යන්ත්‍රෝපකරණ ඉංජිනේරුගෙන් සහතිකයක් ලබාගෙන නොතිබුණි. |
| (ii) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 | 288,072 | (i) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| | | 331,704 | (ii) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තමාට වෙන්කරන ලද වාහනයට ඉන්ධන දීමනාව ලබාගැනීමට අමතරව සංචිත වාහනද භාවිතා කර තිබුණි. |
| (iii) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 | 1,531,890 | | කිලිනොච්චි,වවුනියා, මන්නාරම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා වවුනියා මහ රෝහල විසින් රු.250,000 ක් වූ උපරිම ණය මුදල් සීමාවට පටහැනිව ආපදා ණය ලබා දී තිබුණි. |

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 | - | (i) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| | | 61,517,143 | (ii) | උතුරු පළාතේ පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා දේශිය මට්ටමේ පෝෂණ මැදිහත් වීම් ව්‍යාපෘතිය (JSDF) විසින් ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 | - | | අමාත්‍යාංශ 04 ක් සහ දෙපාර්තමේන්තු 25 විසින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා නියමිත දිනයන්ට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 | 93,172 | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශ තුනක් හා දෙපාර්තමේන්තු හතක් විසින් දුරකථන ගාස්තු ගෙවා තිබුණි. |
| (උ) | 2008 ජනවාරි 01 දිනැති 2006 අංක 12 දරන මුද්දර බදු (සංශෝධිත) පනත | 14,050 | මුද්දර ගාස්තු අයකර ගැනීමෙන් තොරව අමාත්‍යාංශ 3 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් ගෙවීම් සිදු කර තිබුණි. |
| (ඌ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | - | ගොවිපොළ 2 ක් හා එක් කර්මාන්තයක් විසින් තත් කාර්ය ශ්‍රමිකයන් සඳහා රු.5,475,861 ක වැටුප් ගෙවා තිබුණි. එහෙත් සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකයන් සිදුකර නොතිබුණි. |

(ii) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

(අ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර විගණනය සඳහා ඉල්ලා සිටියද ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 01 වගන්තිය ප්‍රකාරව එකතු කළ අගය මත බදු සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් වාර්ෂික ඇස්තමේන්තුවල වෙනම ප්‍රතිපාදනයන් කර නොතිබුණි. එබැවින් පළාත් සභාවේ විවිධ ආයතන විසින් බාහිර පාර්ශ්වයන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු පළාත් භාණ්ඩාගාරය විසින් ගණනය කළ නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදනයක් නොමැතිව ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් සැලකිය යුතු මුදලක් එකතු කළ අගය මත බදු ලෙස පළාත් භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණි.

(ඇ) ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික ලේකම් හට සමාලෝචිත වර්ෂය තුළ රු.106,200 ක් මාසික වැටුප් ලෙස ගෙවා තිබුණද, එම වැටුප් මත උපයන විට ගෙවීම් බදු මාස 07 ක කාලයක් සඳහා අයකර ගෙන නොතිබුණි.

(iii) මධ්‍යම රජයේ ප්‍රතිපත්තිවලට පටහැනිව ආයතනික කරුණු ක්‍රියාත්මක කිරීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1999 ජූනි 01 දිනැති අංක පීඩී/බීපී/9 දරන චක්‍රලේඛයට අනුව පළාත් රාජ්‍ය සේවා නිලධාරීන්ගේ ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු දරන නිලධාරීන්ට අදාළ පරිපාටිවලට හැකිතාක් දුරට අනුකූල විය යුතුය.

එම විධිවිධානවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(අ) විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2011 ජනවාරි සිට පළාත් සභාව විසින් කාර්යාල කටයුතු සඳහා කුලී පදනම මත ගොඩනැගිලි 26 ක් ලබාගෙන තිබුණු අතර 2011 සිට 2014 දක්වා වර්ෂ තුළ දළ වශයෙන් රු.මිලියන 25 ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව මෙම නිවාසවල පදිංචි වී සිටි ලේකම්වරුන්ගෙන් රු.500 ක මාසික කුලියක් පමණක් අයකර තිබුණි. එක් ලේකම්වරයෙකුට රු.250,000 (දළ වශයෙන්) ට වැඩි වටිනාකමක් ඇති ගෘහ භාණ්ඩ විෂයයන් සහිතව මෙම නිවාස සම්පූර්ණයෙන් සකස් කර තිබූ අතර මෙම නිවාසවල විදුලි බිල් හා ජල බිල්පත් ද පළාත් සභා අරමුදල්වලින් ගෙවා තිබුණි. කුලී නිවාසවල පදිංචිය සඳහා ලේකම්වරුන්ගෙන් නිවාස කුලී හා ඔවුන් විසින් නිරවුල් කළ යුතු ජල බිල්පත් හා විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය කොමසාරිස්වරු සඳහා සේවක සංඛ්‍යාව 2013 වර්ෂයේදී අනුමත වී තිබූ නමුත් පත් වූ පළාත් සභාව එම අවස්ථාවේදී පිහිටුවා නොතිබුණද කිලිනොච්චි, යාපනය, වවුනියා හා මුලතිව් සඳහා කොන්ත්‍රාත් පදනම මත ප්‍රාදේශීය

කොමසාරිස්වරුන් ලෙස පත්කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන යළි සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් විසින් ප්‍රාදේශීය කොමසාරිස්වරුන්ගේ කාර්යභාරය සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2011 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වාහන නඩත්තු, ඉන්ධන හා වෙනත් කාර්යාල නඩත්තු වියදම්වලට අමතර වශයෙන් රු.9,095,424 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ඔවුන්ට ගෙවා තිබුණි. තවද ප්‍රාදේශීය කොමසාරිස්වරුන්ගේ කාර්ය සාධනය/ කරන ලද කාර්ය භාරයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3. ආදායම් කළමනාකරණය**

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, පසුගිය වර්ෂ 5 තුළ රැස්කළ මුළු ආදායම පහත දැක්වේ.

| **විස්තර** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | | | |
|---|---|---|---|---|---|
| | **2014** | **2013** | **2012** | **2011** | **2010** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| බදු අදායම | 1,754.66 | 1,410.33 | 1,532.01 | 1,228.77 | 77.21 |
| බදු නොවන ආදායම | 111.80 | 121.88 | 116.68 | 84.00 | 77.98 |
| එකතුව | 1,866.46 | 1,532.21 | 1,648.69 | 1,312.77 | 155.19 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය සඳහා මත්පැන් බලපත්‍ර ගාස්තුවලින් ආදායම පළාත් සභාවේ වාර්ෂික අයවැයෙහි ඇස්තමේන්තුගත කර නොතිබුණු අතර මත්පැන් බලපත්‍ර වලින් එකතු කරන ලද ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ii) පළාත් සභාව විසින් ප්‍රඥප්ති සම්මත කර ගැනීමකින් තොරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනයේ විධිවිධාන ප්‍රකාරව රජයේ නිලනිවාස කුලී, අත්තිකාරම් ගිණුම් මත පොලී, වාහන බලපත්‍ර ගාස්තු හා මුද්දර ගාස්තු ආදී රු.1,866,491,659 ක් වූ ආදායම පළාත් සභා අරමුදල්වලට ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කරගත් ශුද්ධ ආදායම අතර වූ රු. 621,386,791 කින් ආදායම රැස්කිරීමේ ඌනතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) උතුරු පළාතේ මහනගර සභා 1 ක, නගර සභා 5 ක සහ ප්‍රාදේශීය සභා 28 ක වරිපනම්, බදු, කුලී හා කල්බදු ආදී ප්‍රධාන ආදායම් ප්‍රභවයන්ගෙන් රු.1,270,711,372 ක් වූ හිඟ ආදායම 2014 දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමෙන් තොරව පැවතුණි.
විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | හිඟ ආදායම |
|---|---|---|
| | | රු. |
| යාපනය | 17 | 1,021,510,604 |
| මුලතිව් | 04 | 43,809,393 |
| කිලිනොච්චි | 03 | 24,385,685 |
| වවුනියා | 05 | 82,639,500 |
| මන්නාරම | 05 | 98,366,190 |
| | 34 | 1,270,711,372 |

(v) උසාවි දඩ හා මුද්දර ගාස්තු

ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව, උසාවි මඟින් පනවන ලද දඩ සම්බන්ධයෙන් හා දේපල පැවරීම්වලට අදාළ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් එකතු කරන ලද එකතුව රු.948,215,350 ක මුදලක් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දක්වා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා ගෙන තිබුණි.

විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | හිඟ මුද්දර ගාස්තු | හිඟ උසාවි දඩ |
|---|---|---|
| | රු. | රු. |
| යාපනය | 768,755,626 | 30,190,369 |
| මුලතිව් | 749,000 | 25,833,708 |
| කිලිනොච්චි | 8,460,585 | 2,591,367 |
| වවුනියා | 15,623,590 | 21,218,143 |
| මන්නාරම | 73,119,492 | 1,733,470 |
| එකතුව | 866,708,293 | 81,567,057 |

(vi) ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් පළාත් සභා නිලධාරීන්ගෙන් මුදල් එකතු කර ගැනීම

පළාත් සභාව විසින් නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. කෙසේ වුවද නිලධාරීන්ගෙන් ආදායම එකතු කර ගැනීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නියම කරන ලද රේටයට අනුව සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික්කය ඇතුළත සේවය සඳහා රු.මිලියන 6.3 ක පිරිවැයකට බස්රථ 4 ක් හා දිස්ත්‍රික්කයෙන් පිට ප්‍රවාහන සේවය සඳහා රු.මිලියන 6.1 ක පිරිවැයකට බස්රථ 3 ක්ද යොදවා තිබුණි. කෙසේ වුවද ප්‍රවාහන සේවා සඳහා නිලධාරීන්ගෙන් අයකරන ලද රු.මිලියන 3.2 ක ආදායම මුළු වියදමින් සියයට 26 ක් විය . එබැවින් ආදායම් නිලධාරීන් විසින් ප්‍රවාහන සේවා විධිමත්ව සැලසුම් කර කළමනාකරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.356,635,921 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත්

වර්ෂයේ අතිරික්තය රු.94,044,004 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.262,591,917 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.2,248,104,465 කින් හා බදු ආදායම රු.344,330,899 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු.මිලියන 15,892 ක් වූ අතර ඉන් රු.මිලියන 13,925 ක් පුනරාවර්තන වියදම සඳහා දරා තිබුණි. එය මුළු වියදමින් සියයට 88 ක් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමෙන් රු.මිලියන 10,642 ක මුදලක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 76 ක් නියෝජනය විය. ඉකුත් වර්ෂයේ ඊට අනුරූප පුනරාවර්තන වියදම රු.මිලියන 12,002 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ මුළු වියදමෙන් සියයට 88 ක් නියෝජනය විය.

## 4.3 ව්‍යුහයාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ආදායම | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන |
| ආදායම් විෂයයන් | | | | | | |
| බදු හා බදු නොවන ආදායම | 1,949 | 1,866 | (83) | 2,088 | 1,532 | (556) |
| රජයේ ප්‍රදාන | 14,647 | 14,382 | (265) | 12,653 | 12,134 | 519 |
| | 16,596 | 16,248 | (348) | 14,741 | 13,666 | (37) |

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| වියදම | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන | රු .මිලියන |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 10,788 | 10,642 | 146 | 10,085 | 9,317 | 768 |
| වෙනත් | 3,803 | 3,283 | 520 | 2,798 | 2,685 | 113 |
| උප එකතුව | 14,591 | 13,925 | 666 | 12,883 | 12,002 | 881 |
| මූලධන වියදම් | 2,005 | 1,967 | 38 | 1,858 | 1,570 | 288 |
| මුළු එකතුව | 16,596 | 15,892 | 704 | 14,741 | 13,572 | 1,169 |

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෝටර් වාහන ආදායම් බලපත්‍ර යටතේ හිඟ ආදායම නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ii) උපයෝජනය නොකළ ප්‍රතිපාදන

අයවැය මාර්ගෝපදේශ, පළාත් මූල්‍ය රීති හා මුදල් කොමිසමේ මාර්ගෝපදේශවල සඳහන් කර ඇති පරිදි පළාත් අවශ්‍යතා සැලකීමෙන් තොරව අයවැය යෝජනා පිළියෙල කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල වැය ශීර්ෂ 34 ක් යටතේ එකතුව රු.784,291,612 ක් වූ සමස්ත ප්‍රතිපාදනය අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා වැය ශීර්ෂ 12 ක් යටතේ ලබා ගත් රු.11,011,251 ක් වූ පරිපූරක ප්‍රතිපාදන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(iv) බලය නොලත් වියදම්

-----------------------

ප්‍රතිපාදන නොමැතිව ආයතන 14 ක් විසින් එකතුව රු.116,716,302 ක් වූ මූලධන වියදම් දරා තිබූ අතර අධිහාර ගිණුමක් මඟින් වර්ෂය අවසානයේදී වියදම් නීත්‍යානුකූල කර තිබුණි.

## 5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

උතුරු පළාතේ දිස්ත්‍රික් 5 ක ළමා නිවාස 45 ක් ක්‍රියාත්මක වේ. කෙසේ වුවද ලියාපදිංචිය නොමැතිව ක්‍රියාත්මක වන ලියාපදිංචි නොවූ ළමා නිවාස 14 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

## 5.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නීති උපදේශකවරයෙකු සේවක සංඛ්‍යා අනුමැතිය පරිදි SL-1 වැටුප් පරිමාණය සඳහා හිමිකම් ලැබුවද, රු.50,000 ක වැටුපකට ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. එබැවින් රු.324,780 ක මුදලක් ඔහුට වැඩිපුර ගෙවා තිබුණි. තවද, පුරප්පාඩුව පිරවීම සඳහා නීති උපදේශක තනතුරට පත් කිරීම සඳහා පුරප්පාඩුව පුවත්පත්වල පළකර නොතිබූ බව ද නිරීක්ෂණය විය.

(ii) තවත් නීති උපදේශකවරයෙකු සේවක සංඛ්‍යා අනුමැතිය පරිදි SL-1 වැටුප් පරිමාණයට හිමිකම් ලැබුවද, රු.75,000 ක වැටුපකට කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන ලේකම් විසින් පත්කර තිබුණි. එබැවින් රු.624,780 ක මුදලක් ඔහුට වැඩිපුර ගෙවා තිබුණි. තවද, පුරප්පාඩුව පිරවීම සඳහා නීති උපදේශක තනතුර සඳහා පත් කිරීම පුවත්පත්වල පළ කර නොතිබූ බව ද නිරීක්ෂණය විය.

(iii) චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමෙන් තොරව, ආණ්ඩුකාරවරයා විසින් නියම කරන ලද මුදල පදනම් කරගෙන ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂය තුළ මාධ්‍ය සම්බන්ධීකාරකට රු.430,000 ක මුදලක් ගෙවා තිබුණි.

(iv) චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමෙන් තොරව, ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් නියම කරන ලද මුදල පදනම් කරගෙන ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් මාධ්‍ය උපදේශක සඳහා සමාලෝචිත වර්ෂය තුළ පුවත් සංස්කරණ ගාස්තු ලෙස රු.182,400 ක මුදලක් ගෙවා තිබුණි.

(v) චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමෙන් තොරව, ආණ්ඩුකාරවරයා විසින් නියම කරන ලද මුදල පදනම් කරගෙන ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂය තුළ ත්‍රිභාෂා ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සඳහා රු.265,161 ක මුදලක් ගෙවා තිබුණි.

(vi) අධ්‍යාපනික සම්මන්ත්‍රණය සඳහා සපයන ලද මත්පැන් හා කෑම වර්ග සඳහා රු.54,795 ක මුදලක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

(vii) රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා රජයේ අරමුදලින් සුභසාධන කාර්යයන් සැපයීම සඳහා රීති හා රෙගුලාසිවල විධිවිධාන නොමැති වුවද සමාලෝචිත වර්ෂය තුළ සුභසාධන විෂයයන් කාර්යාල ප්‍රයෝජනය සඳහා මිලදී ගැනීමට ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් එකතුව රු.941,375 ක් වූ වියදම් දරා තිබුණි.

(viii) පළාත් මාර්ග ව්‍යාපෘති

(අ) පෙර වර්ෂයේදී කොන්ත්‍රාත් පැකේජයක් සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්කරුවකු රු.මිලියන 68 ක අතිරේක හිමිකමක් ඉල්ලා තිබූ අතර ඒ සඳහා තීරක තීන්දු ක්‍රියාවලිය 2015 අප්‍රේල් 30 වන විටත් විසඳී නොතිබුණි.

(ආ) සන්දිලිපායි- කන්දරෝඩෙයි මාර්ගය, කුප්පිලාන් - කුරුම්බසිඩි මාර්ගය පුනරුත්ථාපනය කිරීම් සඳහා කොන්ත්‍රාත්තු, කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් මාසයේදී ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු උතුරු පළාත් සභාව සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබුණේ 2014 ඔක්තෝබර් 10 දින දීය.

(ix) උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (NRCP)

(අ) වල්ලායි සිට අරාලි මාර්ගයේ කිලෝ මීටර් 0+000 සිට කිලෝ මීටර් 27+400 දක්වා පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2011 මැයි මාසයේදී ප්‍රදානය කර තිබූ අතර, කිලෝ මීටර් 4+140 සිට කිලෝ මීටර් 9+200 දක්වා මාර්ග කොටස පිළිබඳ පුනරුත්ථාපන වැඩ ආරක්ෂක හේතූන් මත ඉවත් කර තිබුණි. කෙසේ වුවද පූර්ව අනුමැතියක් නොමැතිව පුනරුත්ථාපන වැඩ සඳහා අවශ්‍ය සම්පූර්ණ පස් අවශ්‍යතාවය කොන්ත්‍රාත්කරු විසින් කිලිනොච්චි ප්‍රදේශයේ සිට ප්‍රවාහනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත්කරු අතර ආරවුලක් පැන නැඟී අතර කොන්ත්‍රාත්කරුට රු.මිලියන 91.20 මුදලක් ගෙවීම සඳහා ගිවිසුමක් සහිතව එය නිරවුල් කර තිබුණි. තීරක විනිශ්චයකරුවන්ට රු.මිලියන 1.62 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඉහත ආරවුලට අමතරව, 2011 මැයි 10 දින ප්‍රදානය කරන ලද තෝනිගල සිට ගල්කුලම මාර්ගයේ පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව මත "Dense Graded Aggregate Base Course" සඳහා ප්‍රමාණ පත්‍රවල රේටයන් සියයට 115 කින් වැඩි කිරීම සම්බන්ධයෙන් තවත් ආරවුලක් පැන නැඟ තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් මාසයේදී ආරවුල නිරවුල් කිරීම මත පදනම්ව ව්‍යාපෘතිය විසින් රු.මිලියන 25.70 ක මුදලක් කොන්ත්‍රාත්කරුට අතිරේකව ගෙවා තිබුණි. කෙසේ වුවද සැලසුම් උපදේශක විසින් පිළියෙල කරන ලද අසම්පූර්ණ ප්‍රමාණ පත්‍රය හේතුවෙන් අදාළ ආරවුල පැන නැඟ තිබූ බව පසුව අනාවරණය වූ අතර, වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(X) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා දේශීය මට්ටමේ පෝෂණ මැදිහත්වීම් ව්‍යාපෘතිය (JSDF)

(අ) උතුරු පළාතේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ වාහන සංචිතය මෝටර් වාහන 08 කින් සමන්විත වුවද පෝෂණ මැදිහත්වීම් වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා වෙන්කරන ලද ප්‍රදානවලින් 2014 ජුනි 30 දින රු.මිලියන 9.4 ක පිරිවැයකට වෑන් රථයක්ද ප්‍රසම්පාදනය කර තිබුණි.

(ආ) ඖෂධ නිකුත් කිරීම සඳහා යොදා ගැනීමට කවර සපයා, මුද්‍රණය කර, ඇලවීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුවේ වෙනම වෙන්කිරීම් කර තිබුණද ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1.39 ක මුදලක් එම වියදම් සඳහා වැය කර තිබුණි. කෙසේ වුවද කවර බෙදා හැරීම, අතැති තොගය ආදීය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5.4 දෘශ්‍ය අක්‍රමිකතා

(i) ඉන්ධන දීමනා වැඩිපුර ගෙවීම - රු.179,747

(අ) උතුරු පළාතේ ප්‍රධාන ලේකම්වරයාට ඩීසල් වෑන් රථයක් වෙන්කර තිබුණද පෙට්‍රල් වාහනයක් සඳහා රු.36,585 ක මාසික ඉන්ධන දීමනාවක් ප්‍රධාන ලේකම්වරයාට ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඩීසල් වාහනයක් වෙනුවට පෙට්‍රල් වාහනයක් වෙනුවෙන් ඉන්ධන දීමනාව ගෙවීම හේතුවෙන් රු.110,475 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) උතුරු පළාතේ ප්‍රධාන ලේකම්ට ලීටර් 225 ක මාසික ඉන්ධන වෙන්කිරීමක් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කරන ලද වාහනයට ඉන්ධන ලබාගැනීම සඳහා ඉන්ධන ඇණවුම් භාවිතා කර තිබුණි. මේ සම්බන්ධයෙන් අතිරේක ඉන්ධන ලබාගැනීම සඳහා රු.69,272 ක මුදලක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ III වගන්තියට පටහැනිව කාර්යාල වේලාව තුළදී සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ යටතේ වැඩ කිරීම වෙනුවෙන් සම්පත් දායකයන්ට රු.227,150 ක ගෙවීමක් කර තිබුණි.

(iii) ආණ්ඩුකාරවරයාගේ අභිමතික ව්‍යාපෘතියෙන් වියදම

ආණ්ඩුකාරවරයාගේ අභිමතික ව්‍යාපෘතියෙන් වැය කරන ලද රු.4,690,150 ක් වූ වියදම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගෙවීම් ස්වභාවය | මුදල |
|---|---|
| | රු. |
| ටින් ෂීට්ස් 1000 | 1,190,000 |
| අත් පන්දු, දැල් පන්දු හා පැසි පන්දු ක්‍රීඩා පිටි ඉදිකිරීම | 3,000,000 |
| මහන මැෂින් 05 | 107,495 |
| පා පැදි 2 | 25,200 |
| ළමුන් සඳහා ක්‍රීඩා විෂයයන් | 367,455 |
| | 4,690,150 |

ඉහත විෂයයන් මිලදී ගැනීමේ අරමුණ, බෙදා හරින ලද විෂයයන් පිළිබඳ ප්‍රතිලාභී ලැයිස්තු හා ලබාගත් පුද්ගලයන්ගෙන් ලැබූ බවට සනාථ කිරීම් ආදී ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) කුලී ගොඩනැගිලිවල ඉදිකිරීම් වැඩ

පුද්ගලික පාර්ශවයන්ට අයත් කුලියට ගත් ගොඩනැගිලිවල රු.1,586,038 ක පිරිවැයකට තාවකාලික මඩු, වාහන ගාල් කිරීමේ ස්ථාන සහ පාපැදි මඩු ඉදිකර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | නිම කළ වැඩවල ස්වභාවය | පිරිවැය |
|---|---|---|
| | | රු. |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන | තාවකාලික බඩු ඉදිකිරීම | 258,096 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් | වාහන ගාල් කිරීමේ ස්ථාන හා පාපැදි මඩු ඉදිකිරීම. | 477,111 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් | මඩුවක් ඉදිකිරීම. | 116,520 |
| ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය | වාහන ගාල් කිරීමේ ස්ථානයක් ඉදිකිරීම. | 119,872 |
| ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය | වාහන ගාල් කිරීමේ ස්ථානයක් ඉදිකිරීම. | 614,439 |
| | | 1,586,038 |

(v) පළාත් අරමුදලින් පුද්ගලික ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම (වීරසිංහම් ශාලාව)

පුද්ගලික ගොඩනැගිල්ලක (වීරසිංහම් ශාලාව) ප්‍රතිසංස්කරණ වැඩ සඳහා ටෙන්ඩර් පරිපාටියට යොමු වීමෙන් තොරව යාපනය, ආරක්ෂක සේනාංක මූලස්ථානයේ, 51

කොට්ඨාශයට රු.මිලියන 12.52 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් බිල්පත්‍ර, ඉන්වොයිසි, වැඩ නිම කිරීම් සහතික ආදී වියදම සඳහා සාක්ෂි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) යාපනයේ විශේෂ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම සඳහා දරන ලද වියදම රු.981,355

විශේෂ දිස්ත්‍රික් කමිටු රැස්වීම සම්බන්ධයෙන් පහත සඳහන් වියදම් ගනුදෙනුවල ආර්ථිකභාවය සැලකීමෙන් තොරව පළාත් අරමුදලින් ගෙවා තිබුණි.

| ආයතනයේ නම | ගෙවීම් ස්වභාවය | මුදල |
|---|---|---|
| | | රු. |
| තල් සෙවණ නිවාඩු නිකේතනය | තේ පැන් සංග්‍රහය හා දිවා ආහාර | 149,000 |
| PRI 51 කොට්ඨාසය | රියැදුරන්ට හා ආරක්ෂක බලකායන්ට තේ හා දිවා ආහාර | 82,000 |
| PRI 51 කොට්ඨාසය | ආහාර විෂයයන් | 3,555 |
| කැක්ස්ටන් ප්‍රින්ටර්ස් | බෝඩ් සෑදීම | 155,300 |
| කැක්ස්ටන් ප්‍රින්ටර්ස් | නව බෝඩ් සෑදීම හා ෆ්ලෙක්ස් ප්‍රින්ටින් | 35,400 |
| ජන ඩිජිටල් ප්‍රින්ටින් | බැනර් ප්‍රින්ටින් | 54,600 |
| ජන ඩිජිටල් ප්‍රින්ටින් | හොර්ඩින් සැලසුම් ගාස්තු | 70,400 |
| තරුණ ඩිජිටල් මීඩියා වර්ක්ස් | ෆ්ලෙක්ස් ප්‍රින්ටින් | 17,600 |
| තරුණ ඩිජිටල් මීඩියා වර්ක්ස් | වීරසිංහම් ශාලාවේ එන්ට්‍රි කටවුට් | 71,000 |
| කරිශ් ගාඩ්න් | පැල සහිත පෝච්චි | 89,000 |
| බාස්කරන් සිටිපලයම් | එලක සෑදීමේ ගාස්තු | 145,000 |
| කරිශ් ගාඩ්න් | පැල සහිත පෝච්චි | 8,500 |
| SKS කන්ස්ට්‍රක්ෂන් | පිළිගැනීම් තොරණ සෑදීම | 85,000 |
| නුආ කර්ටන් ෆැෂන් | කර්ටන් වැඩ | 15,000 |
| | | 981,355 |

තවද ඉහත වියදම අනියම් වැය විස්තර 400-03-02-1703 ට අයකර තිබුණද මුල් වවුචර, ඉන්වොයිසි, වැඩ නිම කිරීම් සහතික, ගෙවීම ලැබූ බවට සනාථ කිරීම් හා ඉන්වෙන්ට්‍රි සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(vii) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අක්‍රමිකතා හා වැරදි

තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ව්‍යාපෘති ඉංජිනේරුවරයා වූ අතර ඔහු විසින් කොන්ත්‍රාත් කිහිපයක් සඳහා ගෙවීම් නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද එම කොන්ත්‍රාත්තු ඔහුගේ පියාට අයත් "M/S ස්කාලට් එන්ජියරින්" ඉදිකිරීම් සමාගම විසින් සිදු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින්ම මෙහෙයවා තිබුණි. ව්‍යාපෘති වැඩ සම්බන්ධයෙන් අයිතිය පිළිබඳ ගැටුම පිළිබඳ තොරතුරු ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් ප්‍රකාශ කර නොතිබුණි. කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් අයිතිය පිළිබඳ ගැටුම හේතුවෙන් පහත සඳහන් වැරදි සිදු වී තිබුණි.

(අ) අයිතිය පිළිබඳ ගැටුම සැලකීමෙන් තොරව ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවට ව්‍යාපෘති ඉංජිනේරු විසින් වැඩ පිළිබඳ අතිරේක රේට උපලේඛනය (Extra Schedule of Rates) අනුමත කර තිබුණි.

(ආ) අදාළ අධිකාරියෙන් අවසරය ලබා ගැනීමෙන් තොරව 'බී' කවරයේ වෙනස් කිරීම් සිදුකර තිබූ අතර වෙනස් කරන ලද මුදලට ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) මාන්නන්ඩි වෙළඳපොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.මිලියන 1.14 වටිනාකමට අතිරේක රේට උපලේඛන ගෙවීම් 04 ක් සිදු කර තිබුණි. මෙම වැඩ බිමෙහි අතිරේක වැඩ සිදු කර නොතිබූ බව ද නිරීක්ෂණය විය.

(ඈ) "M/S ස්කාලට්" ඉංජිනේරු ඉදිකිරීම් සමාගමට පිරිනමන ලද ඉදිකිරීම් වැඩ බොහෝමයක් කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනිව වෙනත් ඉදිකිරීම් සමාගම්වලට උප කොන්ත්‍රාත්තු දී තිබුණි.

(ඉ) ව්‍යාපෘති ඉංජිනේරු විසින් අතිරේක වැඩ ඉතා ඉහළ රේටයන්ට කොන්ත්‍රාත්කරුට පවරා තිබූ අතර ව්‍යාපෘති ඉංජිනේරු විසින්ම ඉහළ රේටයන් නිර්දේශ කර තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ මිලියන කිහිපයක් ඇතුළත් ව්‍යාපෘති කාර්යාලයේ ඇති වූ ඉහත සඳහන් අක්‍රමිකතා පිළිබඳව අදාළ අධිකාරීන් විසින් විමර්ශන සිදු කර නොතිබූ අතර මෙම අක්‍රමිකතා සඳහා ඍජුවම හෝ වක්‍රව සම්බන්ධ වූ නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි.

(viii) ආණ්ඩුකාරවරයාට ගෙවන ලද ඉන්ධන දීමනාව

ආණ්ඩුකාරවරයා රු.264,500 ක මාසික ඉන්ධන දීමනාවකට පමණක් හිමිකම් ලබා තිබුණද, ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010 මැයි 14 දිනැති අංක සීඩී/1/17/1 දරන චක්‍රලේඛයට පටහැනිව රු.247,400 සිට රු.497,600 දක්වා වූ මාසික ඉන්ධන දීමනා ආණ්ඩුකාරවරයාට ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.1,714,840 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද රජයේ වාහනවලට සුපර් පෙට්‍රල් සැපයීම සඳහා චක්‍රලේඛයේ විධිවිධාන නොමැති වුවද සුපර් පෙට්‍රල් මිලදී ගැනීම සඳහා ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. ආණ්ඩුකාරවරයාට මාසයකට අතිරේකව ගෙවන ලද රු.50,000 ක ඉන්ධන දීමනා මත උපයන විට ගෙවීම් බදු අය කර ගෙන නොතිබුණි.

(ix) රු.50,000 ක මාසික දීමනාවකට ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය සඳහා නීති උපදේශකවරයෙකු පත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලික නීතිඥවරයෙකුට නීති වියදම් ලෙස රු.143,780 ක මුදලක් ගෙවා තිබුණි.

(x) පාඨමාලා ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම

උසස් ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව උසස්වීම් සඳහා අවශ්‍යතාවයක් ලෙස සේවා ව්‍යවස්ථාවේ දක්වා නොතිබුණද, ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා තාක්ෂණ නිලධාරියෙකුට රු.150,000 ක මුදලක් ගෙවා තිබුණි.

(xi) ගනුදෙනුවල වංචනික ස්වභාවය

2013 වර්ෂයේදී වරප්‍රසාද අඩු ළමුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ගැටුම්වලින් බලපෑමට ලක් වූ ශිෂ්‍යයින්ට සහාය සඳහා යාපනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් රු.මිලියන 5 ක ගෙවීමක් මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව සහතික කිරීමකින් තොරව යාපනය ආරක්ෂක මූලස්ථාන සම්බන්ධීකරණ නිලධාරියාට (PRI) ගෙවා තිබුණි. කෙසේ

වුවද රු.මිලියන 5 ක ගෙවීම සාධාරණීකරණය කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(i) ඇගයීම් කළ ඉලක්ක කණ්ඩායම

(ii) ග්‍රාම නිලධාරි/ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

(iii) අදාළ අමාත්‍යාංශය විසින් එක් එක් තෝරා ගැනීම් නිර්නායකය යටතේ තෝරා ගැනීම් විස්තර

(iv) අදාළ පාසැල්වල විදුහල්පතිවරුන්ගෙන් හා යාපනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් නියාමන හා ඇගයීම් වාර්තාව

(v) අදාළ පාසැල්වල විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් කරන ලද තෝරා ගත් සිසුන්ගේ ප්‍රගතිය

(vi) දැනටමත් ප්‍රතිලාභ ලබාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ ලැයිස්තු

(vii) ශිෂ්‍යත්ව ලබාගත් අයගෙන් හෝ තෝරාගත් සිසුන් වෙනුවෙන් ලබාගත්, ලද බවට කුවිතාන්සි/ සනාථන ලියකියවිලි

(viii) යාපනය, ආරක්ෂක සේනාංක මූලස්ථානයේ ලේකම්ට කරන ලද රු.මිලියන 5 ගෙවීම සඳහා අනුමැතිය

**(xii) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් කරන ලද රු.4,418,506 ක වංචනික ගෙවීම.**

**-------------------------------------------------------------------------------------**

උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 කින් 03 කට අදාළ ගෙවීම් පිළිබඳව සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී ලංසු කියවිලිවල එක් එක් ප්‍රමාණපත්‍ර විෂයයන් සඳහා රේටයන් වෙනස්කිරීම මඟින් රු.4,418,506 ක වංචනික ගෙවීම් ඒ අනුව කර තිබූ බව අනාවරණය විය.

(xiii) යාපනය විශ්ව විද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන කාල පරිච්ඡේදය තුළදී යා/ස්කන්ධවරෝදය ප්‍රාථමික පාසැලට අනුයුක්ත ඉංග්‍රීසි විෂයය ගුරු භවතෙකුට එකතුව රු.105,345 ක්වූ වැටුප් ගෙවීමක් කර තිබුණි. එහෙත් අධ්‍යයන වැඩසටහන් කාල පරිච්ඡේදය තුළදී යාපනය විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් 2012 ජුනි 06 සිට 2012 ඔක්තෝබර් 10 දක්වා (මාස 04 ක්) වැඩ වර්ජනයක් සංවිධානය කර තිබුණු අතර මෙම කාලය තුළ එම ගුරුභවතා විසින් ආපසු රාජකාරිය සඳහා වාර්තා නොකර වැටුප් ලබා ගෙන තිබුණි.

(xiv) වංචනික අධ්‍යාපන සුදුසුකම් ප්‍රතිඵල වාර්තා ඉදිරිපත් කිරීම හේතුවෙන් යා/ වඩ්ඩු මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුභවතෙකු 2000 ජුනි මාසයේදී වැඩ තහනමකට ලක් වී තිබුණි. කෙසේ වුවද විමර්ශනයක් පැවැත්වීමට හෝ 1992 ඔක්තෝබර් 07 සිට 2000 මැයි 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ඔහුට ගෙවන ලද එකතුව රු.286,737 ක වැටුප් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5.5 දෙපාර්තමේන්තුවේ අරමුණුවලට පරිබාහිර වූ වියදම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ අරමුණුවලට පරිබාහිර ගනුදෙනු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.8,279,632 ක වියදමක් දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගෙවීම් ස්වභාවය | මුදල |
|---|---|
| | රු. |
| මසා නිමි කැන්වස් රෙදි (“Readymade Tarpaulins”) | 4,888,332 |
| සපත්තු - Planet, Acer, B first | 979,200 |
| ආහාර විෂයයන් | 998,500 |
| ළදරු ඇඳුම් | 1,000,000 |
| යාපනය නාගවිහාරය ප්‍රතිසංස්කරණ අරමුදල සඳහා ජනෙල් රාමු හා දොර | 282,000 |
| ජනාධිපතිවරයාගේ පදවි ප්‍රාප්තිය 9 වන වසර සඳහා පුවත්පත් දැන්වීම | 131,600 |
| | 8,279,632 |

ඉහත සඳහන් ගනුදෙනු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ඉහත විෂයයන් මිලදී ගැනීම, ප්‍රතිලාභී ලැයිස්තු, ප්‍රතිලාභීන්ගෙන් ලබාගත් බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අරමුණු වලට පරිබාහිර ගනුදෙනු සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,206,119 ක වියදමක් දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගෙවීම් ස්වභාවය | ගනුදෙනු සංඛ්‍යාව | මුදල |
|---|---|---|---|
| | | | රු. |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | බෝගස් වැව නැවත පදිංචි කිරීම හා හින්දු කෝවිලේ පාසැල් වැඩසටහන් වියදම් | 02 | 323,414 |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | දැයට කිරුළ සඳහා නවාතැන් ගාස්තු | 12 | 672,205 |
| ප්‍රධාන අමාත්‍ය අමාත්‍යාංශය | මහ කොමසාරිස්ගේ සමුගැනීම සඳහා දිනපොත් මුද්‍රණය කිරීම | 03 | 210,500 |
| | | | 1,206,119 |

## 5.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අලුත්වැඩියා කළ නොහැකි වාහන 16 ක් වෙන්දේසි කිරීම

උතුරු පළාත් සභාවට අයත් වාහන 16 ක් රු.5,095,000 ක තක්සේරුව මත පොදු වෙන්දේසියක් මඟින් රු.5,412,232 කට විකුණා තිබුණි. කෙසේ වුවද මෙම වාහන අලුත්වැඩියා කළ නොහැකි බව සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් කර නොතිබුණි. පරිපාලන අඩුපාඩු හේතුවෙන් මාස 39 ක් ගතවීමෙන් පසුවද වාහන 10 ක අයිතිය වාහන ගැණුම්කරුවන්ට පවරා නොතිබුණි. පසුව අයිතිය මාරු කිරීමට අදාළ වාහන පොත් හා ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අයිතිකරුවන් දෙදෙනෙකු විසින් ප්‍රධාන ලේකම්ට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් ගොනුකර තිබුණි.

(ii) KX 0299 දරන වෙන්කළ වාහනය සඳහා අතිරේකව ඉන්ධන ගෙවීම

අංක KX 0299 දරන වාහනය උතුරු පළාතේ ප්‍රධාන ලේකම්ට වෙන්කර තිබූ අතර රු.36,585 ක මාසික ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. මාසික ඉන්ධන දීමනාවට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ මෙම වාහනය සඳහා රු.477,537 ක් වටිනා අතිරේක ඉන්ධන සපයා තිබුණි. කෙසේ වුවද 2008 ජුනි 28 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) ගමන් වියදම් ඉල්ලීම රු.254,750

ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය යාපනයේ ස්ථානගතව තිබුණද උප කාර්යාල කිලිනොච්චි, වවුනියා හා කොළඹ පිහිටා තිබුණි. කෙසේ වුවද කොළඹ සහ පිටපළාත්වල ගතකරන ලද දින 426 ක් සඳහා රු.254,750 ක් වූ ගමන් වියදම් ආණ්ඩුකාරවරයාට හා සම්බන්ධීකරණ ලේකම්ට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් කොළඹ නිල රාජකාරී සඳහා පූර්ව අනුමැතිය, ආණ්ඩුකාරවරයා හා සම්බන්ධීකරණ ලේකම් විසින් කොළඹ සිදුකරන ලද රාජකාරීවල ස්වභාවය, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| තනතුර | කාල පරිච්ඡේදය | කොළඹ ගත කළ දින ගණන | ගෙවන ලද සංයුක්ත දීමනා |
|---|---|---|---|
| | | | රු. |
| ගරු ආණ්ඩුකාරතුමා | ජනවාරි සිට නොවැම්බර් (මාස 11) | 223 | 135,250 |
| සම්බන්ධීකරණ ලේකම් | ජනවාරි සිට අගෝස්තු, ඔක්තෝබර් සිට නොවැම්බර් (මාස 10) | 203 | 119,500 |
| | | 406 | 254,750 |

(

iv) ලේකම්වරයාගේ නිවස සඳහා විදුලි බිල් ගෙවීම

---

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඔහුගේ පුද්ගලික නිවසේ පුද්ගලික භාවිතයට අදාළව විදුලි මණු 2 ක් සඳහා රු.74,503 ක මුදලක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(v) පරිවර්තන ගාස්තු ගෙවීම

---

පළාත් සභාවේ සේවය නොකරන ලද පුද්ගලයෙකුට පරිවර්තන ගාස්තු ලෙස රු.80,000 ක මුදලක් අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද ගෙවීම් පදනම හා පරිවර්තනයේ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5.7 ආර්ථික නොවූ ගනුදෙනු**

---

**(i)** උවමනාවන්හි අත්‍යවශ්‍යබව හා ආර්ථික රේටයන් / මිල ගණන් සැලකීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.6,537,650 ක වියදම් දරා තිබුණි.

**(ii) ඩයලොග් රූපවාහිනිය සඳහා ගෙවීම**

---

කාර්යාලයට, උප කාර්යාලවලට හා ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ බංගලාවට සපයන ලද ඩයලොග් රූපවාහිනි 09 ක් සඳහා රු.262,155 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ පළාත් අරමුදලින් ගෙවා තිබුණි.

**(iii) ආණ්ඩුකාරවරයාගේ බංගලාවට, ප්‍රධාන කාර්යාලයට උප කාර්යාලවලට හා ආණ්ඩුකාරවරයාගේ ලේකම්වරයාගේ නිල නිවසට විදුලිය සැපයීම වෙනුවෙන් දරන ලද වියදම්**

---

2012 පෙබරවාරි 16 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 156 දරන අයවැය චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ විදුලි බල ගාස්තු

ලෙස රු.3,557,586 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද මාසයකට දළ වශයෙන් රු.296,466 ක මුදලක් විදුලි ගාස්තු ලෙස ගෙවා තිබුණි.

**(iv) ගුවන් ටිකට්පත් සඳහා දරන ලද වියදම**

දිවයින ඇතුළත, පොදු ප්‍රවාහන පහසුකම් තිබුණද, ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ V වගන්තියට පටහැනිව දිවයින ඇතුළත හෙලිකොප්ටරයකින් ගමන් කිරීම සඳහා ගුවන් ටිකට්පත් සඳහා රු.113,750 ක මුදලක් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය හා ප්‍රධාන ලේකම්ගේ ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

**(v) සංග්‍රහ සඳහා වියදම්**

සමාලෝචිත වර්ෂය තුළ ආර්ථික රේටයන්/ මිල සැලකීමෙන් තොරව ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් රු.539,752 ක සංග්‍රහ වියදම් දරා තිබුණි.

## 5.8 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අරමුදලක් ඇති කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් සම්මත කරන ලද ලියවිල්ලකින් හෝ පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් සම්මත කර ගැනීමෙන් තොරව උතුරු පළාතේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල පිහිටුවා තිබුණි.

(ii) උතුරු පළාත් සභාව සඳහා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලක් 2007 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද එවකට උතුරු නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල ඇති කර ගෙන තිබුණි. 2007 ජනවාරි 01 දිනැති අංක 01/2007 දරන ආණ්ඩුකාරවරයාගේ සටහනේ 03 ඡේදය ප්‍රකාරව, මහජන නියෝජිතයන්ගෙන්, සංවිධානවලින්, සමිතිවලින්, හා භාරගන්නා ලද ව්‍යාපෘතිවලින් උපයන ලද ආදායමෙන් ලැබුණු පරිත්‍යාග හෝ දායකත්වයෙන් ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල සමන්විත විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ එම ප්‍රභවයන්ගෙන් එවැනි දායකත්වයක් ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ

මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ආණ්ඩුකාරවරයාගේ අරමුදලේ රු.138,863,531 ක මුදලක් තිබුණද, විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කිරීම සඳහා දී තිබූ බලය 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන ආණ්ඩුකාරවරයාගේ ලියවිල්ලෙන් ඒකමතිකව අවලංගු කර තිබුණි.

**(iii) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තබා ඇති තැන්පත් මුදල්වලින් ආණ්ඩුකාරවරයාගේ අභිමත අරමුදල ඇති කිරීම**

නිශ්චිත කාර්යයන් සඳහා පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තැන්පතු ගිණුමේ තබා තිබූ අරමුදල් කිහිපයක්, අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආණ්ඩුකාරවරයාගේ අභිමත අරමුදල ඇති කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මාරු කර තිබුණි. පළාත් සභාවේ ප්‍රඥප්තිය සම්මත වීමකින් තොරව ආණ්ඩුකාරවරයා විසින් අභිමත අරමුදල ඇති කිරීම සඳහා පළාත් සභා පනතේ හෝ වෙනත් පනතක විධිවිධාන නොවූ බැවින්,තැන්පතු ගිණුමෙන් අරමුදල් මාරු කිරීම බලය නොලත් මාරු කිරීමක් ලෙස සැලකිය හැකි විය. තවද ආණ්ඩුකාරවරයාගේ අභිමත අරමුදල ඇතිකිරීම සඳහා අරමුදල් මාරු කිරීම සඳහා අනුමැතිය ආණ්ඩුකාරවරයා විසින් තමාම ලබාදී ඇති බවත් ආණ්ඩුකාරවරයාගේ අභිමත අරමුදල සඳහා මාරු කරන ලද මුදල් වර්ෂ 2 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති බවත් නිරීක්ෂණය විය. බලය නොලත් මාරුකිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තැන්පත් කිරීමේ අරමුණ | මුදල<br>රු. | වෙනත් කරුණු |
|---|---|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශය | ජලනළ මිලදී ගැනීම | 11,457,360 | ජලනළ 1600 ක සංඛ්‍යාවක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) ලබාදෙන ලද මුදල - කෙසේ වුවද ජල නළ මිලදී ගෙන නොතිබුණි. (වක්‍රීය අරමුදල ) |
| ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව | මිරිස් හා පොල් ව්‍යාපෘතිය, කෘෂි ළිං නවීකරණය කිරීම | 4,700,000 | ව්‍යාපෘති වැඩ හා කෘෂි ළිං නවීකරණය කිරීම ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | ණය ලබා දීම සඳහා ණයවලින් අයකර ගැනීම් | 32,000,000 | ජීවනෝපාය ණය කළමනාකරණ සේවා ප්‍රතිලාභීන්ට ණය ලබාදීම සඳහා යොදා ගැනීමට තිබූ අරමුදල් උපයෝජනය කර නොතිබුණි. |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 62,135,200 | ව්‍යාපෘති වැඩ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | --------------- | |
| | | 110,292,560 | |
| | | ========== | |

**(iv) නිශ්චිත ප්‍රදාන උපයෝජනය**

**----------------------------------**

2014 දෙසැම්බර් මාසයේදී පළාත් භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 394.58 ක මුදලක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| **අරමුදල් වර්ගය** | **මුදල** |
|---|---|
| | රු. |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 119,532,637 |
| පළාත් අංශ සංවර්ධන ප්‍රදාන (PSDG) | 80,429,081 |
| යුනිසෙෆ් | 2,764,392 |
| ගුරුවරුන්ගේ ද්විතිය අධ්‍යාපන ව්‍යාපෘතිය (TSEP) | 183,447,366 |
| පාසැල් 1000 | 8,405,381 |
| | ------------------ |
| එකතුව | 394,578,857 |
| | =========== |

**(v) පළාත් අරමුදල් උපයෝජනය**

**-------------------------------**

(අ) පළාත් සභාවේ වැඩ යෝජනා සංවර්ධනය කිරීම සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලැබුණු අයවැයගත අරමුදල් සහ ඒ මත දරන ලද තථ්‍ය වියදම පහත දැක්වේ.

| ප්‍රභවයන් පිළිබඳ විස්තර | අයවැයගත | තථ්‍ය වියදම | ඉතිරිය | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,035,000,000 | 1,023,777,230 | 11,222,770 | 99 |
| අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය (ESDP /TSEP) | 290,000,000 | 286,468,036 | 3,531,964 | 99 |
| උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (NRCP) | 1,495,600,000 | 662,316,435 | 833,283,565 | 44 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | 71,777,000 | 50,979,131 | 20,797,869 | 71 |
| පළාත් මාර්ග ව්‍යාපෘතිය (PRP) | 909,400,000 | 811,160,189 | 98,239,811 | 89 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 393,000,000 | 391,438,298 | 1,561,702 | 100 |
| නවෝදයා පාසැල් 1000 උතුරු පළාත් සභාව | 35,000,000 | 34,785,863 | 214,137 | 99 |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 800,000,000 | 8,170,342 | 791,829,658 | 1 |
| ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 690,000,000 | 491,265,559 | 198,734,441 | 71 |
| සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (HSDP) | 180,000,000 | 180,000,000 | - | 100 |
| පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් වැඩසටහන | 60,000,000 | 59,872,589 | 127,411 | 100 |
| | 5,959,777,000 | 4,000,233,672 | 1,959,543,328 | |

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඉහත ප්‍රභවයන්ගෙන් රු. මිලියන 5,959.78 ක් වූ අරමුදල් ප්‍රාග්ධන වැඩ සඳහා අයවැය ගත කර තිබුණි. අයවැයගත මුදලින් රු.මිලියන 1,959.54 ක මුදලක් පළාත් සභාව විසින් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව රු.මිලියන 137.1 ක් හා රු.1,763,531 ක් වූ මුදල් ස්ථාවර තැන්පතු ගිණුම්වල හා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල් ජංගම ගිණුමේ තබා තිබුණි.

**(vi) පළාත් සංවර්ධන සැලැස්ම**

නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ එකතුව රු. මිලියන 1,492 ක් වූ වැඩ යෝජනා 462 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ පිළිබඳ ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා සංඛ්‍යාව |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිම කරන ලද | 361 | 60 | 421 |
| සියයට 50 කට අඩුවෙන් නිමකරන ලද | - | - | - |
| සියයට 50 කට වැඩියෙන් නිම කරන ලද | 32 | 02 | 34 |
| ආරම්භ නොකරන ලද | 06 | 01 | 07 |
| එකතුව | 399 | 63 | 462 |

**(vii)** **රජයේ ප්‍රදාන**

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ප්‍රතිපාදන සහ ඒ මත දරන ලද වියදම සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | ප්‍රතිපාදන | තථ්‍ය වියදම | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | | | රු. |
| (i) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 393,000,000 | 391,438,298 | 1,561,702 |
| (ii) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,035,000,000 | 1,023,777,230 | 11,222,770 |
| | එකතුව | 1,428,000,000 | 1,415,215,528 | 12,784,472 |

## 5.9 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

(i) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත විශ්ලේෂණය කර ඇති පරිදි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක භෞතික සම්පත් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව තිබෙන්ට ඉඩ හැර තිබුණි.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | වටිනාකම | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | යන්ත්‍රෝපකරණ | 07 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |
| | වෙනත් වත්කම් | 07 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි - ශිෂ්‍ය නේවාසිකාගාරය | 01 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 6 කට වැඩි |
| | මෝටර් වාහන | 04 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |
| | මෝටර් වාහන | 05 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 3 කට වැඩි |
| | යන්ත්‍රෝපකරණ | 09 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| | වෙනත් වත්කම් | 122 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 2 කට වැඩි |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | මෝටර් වාහන | 19 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| | ජල නළ | 75 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 2 කට වැඩි |
| | ස්ප්‍රේයර්ස් | 75 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 2 කට වැඩි |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි - කම්කරු නිල නිවාස | 02 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |
| ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව | යතුරු පැදි | 02 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| | වෙනත් වත්කම් | 10 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | වෙනත් වත්කම් | 24 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාහන | 08 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 1 කට වැඩි |
| | ජෙනරේටර් | 01 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි - ආහාර නිෂ්පාදන මධ්‍යස්ථානය හා ඇඹරුම් හළ | 05 | 8,600,000 | වර්ෂ 1 කට වැඩි |

---------



======

(ii) අත්තිකාරම් ගිණුම් කටයුතුවල භෞතික සම්පත් පහත විශ්ලේෂණය කර ඇති පරිදි නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| ආයතනය | වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | වටිනාකම | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| රජයේ බීජ නිෂ්පාදන ගොවිපොළ | ජලනළ | 07 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 3 කට වැඩි |
| පශු සම්පත් ගොවිපොළ | කම්කරු නිලනිවාස හා කාර්යාල ගොඩනැගිලි | 03 | 2,745,066 | වර්ෂ 5 කට වැඩි |
| පේෂ කර්මාන්ත | කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ | 119 | වටිනාකම ලබාගත නොහැකි විය. | වර්ෂ 5 කට වැඩි |
| | | 129 | | |

(iii) කර්මාන්ත දෙපාර්තමේන්තුවේ රු.40,361 ක්වූ පේෂ කර්මාන්ත අවසාන තොගයේ ඇතුළත් බතික් රෙදි අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

(iv) දිස්ත්‍රික් 4 ක පළාත් පාලන ආයතන විසින් වාහන 127 ක් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(v) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල්, කාර්යාලයේ මරුටි ජීප් රථ 01 ක් භෞතිකව පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) යා/ හින්දු කාන්තා විද්‍යාලයට පරිත්‍යාග කරන ලද ලියාපදිංචි අංක NPHO 8754 දරන ත්‍රී රෝද රථය වර්ෂ 03 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(vii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් ඉන්වෙන්ට්‍රි විෂයයන් 1,076 ක් මුදල් රෙගුලාසි 454 හා 751 (1) ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | මෝටර් වාහන | 02 |
| | පරිගණක | 04 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | කැබිනට් | 31 |
| පරිවාස දෙපාර්තමේන්තුව | ජල ටැංකිය | 01 |
| | ජල නළ | 01 |
| | කාර්යාල උපකරණ | 117 |

| | | |
|---|---|---|
| ක්‍රීඩා දෙපාර්තමේන්තුව | වෙනත් වත්කම් | 796 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | වෙනත් වත්කම් | 04 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන | පරිගණක උපාංග | 06 |
| | කාර්යාල උපකරණ | 84 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | පරිගණක උපාංග | 09 |
| | කාර්යාල උපකරණ | 18 |
| කර්මාන්ත දෙපාර්තමේන්තුව | ශීතකරණ | 01 |
| ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව | ෆයිල් කැබිනට් | 02 |
| | | 1,076 |

**(viii) ගබඩා පිළිබඳ වාර්ෂික සමීක්ෂණය**

(අ) පළාත් මුදල් රීති අංක 213 ප්‍රකාරව යාපනය දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 5 ක වාර්ෂික සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඇතැම් පාසැල් විසින් විධිමත් ගබඩා පරිපාලන පරිපාටි අනුගමනය කර නොතිබූ අතර ගබඩා ලෙජර ශේෂයන් හා සමාලෝචිත වර්ෂය අවසානයට භෞතිකව සමීක්ෂණය කරන ලද ශේෂය අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ix) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම සඳහා දේශීය මට්ටමේ පෝෂණ මැදිහත්වීම් ව්‍යාපෘතිය (JSDF)

(අ) 2012 වර්ෂයේදී රු.මිලියන 6.65 පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද වැඩිහිටි උස හා බර මැනීමේ උපකරණ 100 ක් හා ළමා උස හා බර මැනීමේ උපකරණ 80 ක් ජීව වෛද්‍ය ඉංජිනේරුවන් විසින් ක්‍රමාංකනය කර නොතිබීම හා එම විද්‍යුත් උපකරණ භාවිතා කිරීම සඳහා නිලධාරීන් හුරුපුරුදු වී නොතිබීම ආදී කරුණු හේතුවෙන් වර්ෂ 02 කට වැඩි කාලයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල ඌන උපයෝජිතව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ආ) රු.මිලියන 5.3 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 23 කට නිකුත් කරන ලද " මෝටර් ග්‍රයින්ඩර්ස් " 105

ක් තෙකලා විදුලිය සපයා නොතිබීම හේතුවෙන් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබූ බව විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. තවද එම උපකරණ ප්‍රසම්පාදනය කිරීමට පෙර, ආහාර සැකසීමේ කාර්යය සඳහා ප්‍රදේශයෙන් අමු ද්‍රව්‍ය ලබා ගැනීම පිළිබඳව ව්‍යාපෘතිය විසින් සලකා බලා නොතිබුණි.

## 5.10 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1999 සිට 2011 දක්වා වර්ෂ තුළ සිදු වූ රු.48,961,545 ක් වූ පාඩු සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු දෙකක් විසින් පළාත් මුදල් රීති 70 (5) ප්‍රකාරව අවසාන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | මුදල |
|---|---|
| | රු. |
| පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 17,554,713 |
| පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 21,761,867 |
| පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 9,644,965 |
| | 48,961,545 |

(ii) 2011 හා 2012 වර්ෂවල අංක 18 - 0845 දරන වාහනයට සිදුවූ අනතුරු දෙකක් හේතුවෙන් ඇති වූ පාඩු වාර්තා කිරීම සඳහා මුදල් රෙගුලාසි 110 හා පළාත් මුදල් රීති 76 ප්‍රකාරව හානි ලේඛනයක් පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. තවද දෙපාමේන්තුව විසින් මුදල් රෙගුලාසි 102 හා පළාත් මුදල් රීති 68 ප්‍රකාරව අනතුරු දෙකෙහිදී සිදු වූ රු.451,000 ක පාඩු තක්සේරු කර අදාළ පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iii) අංක KE 6032 දරන වාහනයට සිදු වූ අනතුර හේතුවෙන් වූ පාඩු සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 103 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) එකතුව රු.332,200 ක් වූ පෙර වර්ෂ පාඩුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගිණුම් ගතකර නොතිබුණි.

(v) අනතුරක් හේතුවෙන් හානි වූ වාහනය අලුත්වැඩියා කිරීම සඳහා පොලිස් වාර්තාවක් ලබා නොගෙන ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් රු.109,413 ක මුදලක් ගෙවා තිබුණි. මෙම විස්තර විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

(vi) අනතුරක් හේතුවෙන් වූ රු.191,917 ක වාහන අලුත්වැඩියාව ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

## 5.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(i) පළාත් මාර්ග ව්‍යාපෘතිය

(අ) ව්‍යාපෘතිය විසින් සිදු කරන මාර්ග පුනරුත්ථාපන වැඩවල විෂය පථය නිරන්තරයෙන්ම වෙනස් කර තිබූ අතර ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කරන ලද අවස්ථාවේදී විධිමත් බිම් සමීක්ෂණයක් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ලැබුණු තොරතුරු අනුව, යාපනය දිස්ත්‍රික්කයේ ශිවන් කෝවිල් මාර්ගය, වෙලනෙයි - සුරුවිල් මාර්ගය හා යාපනයේ මණ්ඩාතිවු මාර්ගයේ පුනරුත්ථාපන වැඩ පිළිබඳ ප්‍රමාණ පත්‍රවල ඇතුළත් ප්‍රමාණයන් සියයට 36 සිට සියයට 250 දක්වා සැලකිය යුතු ලෙස වෙනස් වී තිබුණි.

(ආ) පැකේජ 02 ක් යටතේ පළාත් මාර්ග 06 ක පුනරුත්ථාපන වැඩ නිමකර 2013 ඔක්තෝබර් 30 දිනට දෝෂ වගකීම් කාලයද අවසන් වී තිබුණද, උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම මාර්ග භාරගෙන තිබුණේ දින 72 සිට දින 132 ක් දක්වා වූ කාල පරිච්ඡේදයක ප්‍රමාදයක් සහිතවය.

(ඇ) පැකේජ 02 ක් යටතේ පළාත් මාර්ග 06 ක පුනරුත්ථාපන වැඩ සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කැලෙන්ඩර් දින 170 කට වඩා දින දීර්ඝ කිරීම් කිසිදු වලංගු හේතුවක් නොමැතිව ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පූර්ව එකඟත්වය ණය ලබාදෙන ලද නියෝජිතායතනයෙන් ලබාගෙන නොතිබුණි.

(ii) පළාත් මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (NRCP)

------------------------------------------------------------

(අ) ව්‍යාපෘතියේ මුල් විෂය පථය යටතේ පිරිනමන ලද කොන්ත්‍රාත් මත පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්ය වාර්තා (mission reports) අනුව, වලායි - අරලායි මාර්ගයේ ස්ථාන කිහිපයක මාර්ග උරහිස් පුළුල් කිරීමට හා පැති බැම් ඉදිකිරීම සඳහා නිකුත් කරන ලද නිර්දේශ ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කාර්ය සාධන පදනම් මාර්ග නඩත්තු වැඩ යටතේ සිදු කරන ලද වැඩවල සේවා මට්ටම තීරණය කිරීමට සහ කාර්ය සාධන දර්ශකයන්ට අනුව ගෙවීම් කිරීම සඳහා මාසික කාර්ය සාධනය ඇගයීමට නිර්නායකයන් ස්ථාපිත කර නොතිබුණි. තවද කාර්ය සාධන පදනම් නඩත්තු කාර්යයන් සඳහා ක්‍රමවේද ප්‍රකාශනයක් (Method Statement) කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කර නොතිබුණි. තවද කාර්යසාධනය පදනම් නඩත්තු වැඩ සඳහා වෙනම කොන්ත්‍රාත් ගිවිසුම් කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස හිමිකම් ඉල්ලීම නිරවුල් කිරීම මත ආරවුල් ඇතිවීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.

(iii) රු.3,181,443 ක පිරිවැයකට සිදු කරන ලද මාන්කුලම් - මුලතිව් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ පිළිබඳ දෝෂ වගකීම් කාලය 2014 ජුලි මාසයට සම්පූර්ණ වී තිබුණි. කෙසේ වුවද අනුකූල වාර්තාවල පෙන්වා දී තිබූ මාර්ගයේ කිලෝමීටර් 18+446 සිට කිලෝමීටර් 20+720 දක්වා කොටස අතර ස්ථාන 11 ක දෝෂ නිවැරදි කිරීම 2014 දෙසැම්බර් 31 වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අතිරේක අරමුදල් සැපයීම් වැඩ පිළිවෙල යටතේ පිරිනමන ලද කොන්ත්‍රාත් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උපදේශක සේවා ගිවිසුමේ විධිවිධාන අනුව, උපදේශක කාර්ය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් කිසිදු මූල්‍යමය හෝ වෙනත් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අනුමත කර නොතිබුණද, උපදේශකගේ තාක්ෂණික

කාර්ය මණ්ඩලයේ රු.86,810 ක් වූ අතිකාල පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) කොන්ත්‍රාත්තු එකඟ වූ නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකිවීමේ අවදානම් සඳහා හේතු වෙමින් කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා භෞතික සම්පත් අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත්තුවේ කාර්යයන් සඳහා ඵලදායීව උපයෝජනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් තත්ත්ව පාලන කළමනාකරු හා කම්කරුවන් ඇතුළත් මානව සම්පත් ප්‍රමාණවත්ව යොදා ගෙන නොතිබුණි.

(iii) තාක්ෂණික පිරිවිතර වෙළුම 3 හි 103.4 ඡේදය අනුව පූර්ව ආරක්ෂක ප්‍රවේශම හා සතුටුදායක ප්‍රවාහන පාලන වැඩපිළිවෙලවල්වලට කොන්ත්‍රාත්කරු අනුකූල විය යුතු අතර වැඩ ක්‍රියාත්මක කිරීමේදී ඒවා අඛණ්ඩව සිදු කළ යුතුය. මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී, ගැඹුරු හෑරීම් ස්ථාන වටා බාධක තබා නොතිබීම, මාර්ගය පටු ස්ථානවල මාර්ග සංඥා නොතිබීම ආදී විශාල ආරක්ෂණ උල්ලංඝණය කිරීම් තිබූ බව ප්‍රගති වාර්තා සහ වැඩබිම් රැස්වීම් සටහන් වලින් දැක්වේ.

(iv) කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ දෝෂ සහිත ස්ථාන සඳහා අනනුකූල නිෂ්පාදන නිවේදන (Non – confirming Product Notifications) නිකුත් කර තිබුණද, අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග සඳහා සැලසුම්, ඉංජිනේරුගේ අනුමැතියට ඉදිරිපත් කිරීම හෝ ඇස්පල්ට් අඩු වූ කොටස් සඳහා නිවැරදි කිරීම් සිදු කිරීමට කොන්ත්‍රාත්කරුවන් විසින් කටයුතු කර නොතිබුණි.

(v) කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි 4.18 වගන්තිය අනුව, එක් එක් කොන්ත්‍රාත්කරු විසින් සෑම මසකදීම පාරිසරික නියාමන වාර්තා ඉදිරිපත් කර තිබුණද කොන්ත්‍රාත්කරුවන් විසින් පාරිසරික අනුකූල පරිපාටි අනුගමනය කර නොතිබූ අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. 2015 මැයි මාසයේදී සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂණවලදී මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය දෙපස ඇති සුන්බුන් හා හෑරීම් ද්‍රව්‍ය ඉවත් කර නොතිබූ බවත් ඇතාකඩ ස්ථානගත කරන ලද තැලීම් පිරියතෙන් හා

ඇස්පල්ට් පිරියතෙන් විමෝචනය වන දූවිලි පාලනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවත් අනාවරණය විය.

(vi) මැදවච්චිය - මන්නාරම මාර්ගය හා යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ සිදුකරන ලද ප්‍රතිසංස්කරණ වැඩ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ජලනළ හා සවිකිරීම් සැපයීමට, හැරීමට, ආපසු පිරවීමට හා නළ එළිමේ කාර්යයන් ව්‍යාපෘතිය විසින් භාර ගෙන තිබූ අතර පිළිවෙලින් රු.මිලියන 15.9 ක් හා රු.මිලියන 16.8 ක් පිරිවැය දරා තිබුණි. කෙසේ වුවද රු.මිලියන 3.8 ක් වටිනාකම වූ නළ හා සවිකිරීම් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව මරදන්කඩවල පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක් ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව පැවතුණි.

(vii) යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම් මත වන්දි ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට කයිට්ස්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.මිලියන 8.19 ක මුදලක් ව්‍යාපෘතිය විසින් මුදා හැර තිබුණි. කෙසේ වුවද අයිතිකරුවන්ගේ ලැයිස්තු හා ලද බවට ඔවුන්ගෙන් සනාථ කිරීම් ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 1.32 ක් වූ වැය නොකළ මුදල තැන්පතු ගිණුමට මාරු කර තිබුණි. ඉඩම් කැබලි 76 ක අයිතිකරුවන් හඳුනාගැනීමෙන් තොරව රු.මිලියන 2.79 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදා හැර තිබූ බවද නිරීක්ෂණය විය.

## 5.12 ප්‍රමාද වූ ව්‍යාපෘති

(i) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුළ දිස්ත්‍රික්ක 2 ක පළාත් පාලන ආයතන විසින් රු.153,456,529 ක් වටිනාකම වූ ව්‍යාපෘති 108 ක් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් තිබුණි.

(ii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුළ රු.162,039,710 ක් වටිනාකම වූ ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් තිබුණි.

**(iii) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) නිම කිරීමේදී සැලකිය යුතු කාලපරිච්ඡේදයක ප්‍රමාදය**

උතුරු පළාතේ සිවිල් වැඩ සම්පූර්ණ කිරීමේදී මාස 02 සිට මාස 08 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් උතුරු පළාතේ ප්‍රාදේශීය සභා විසින් කොන්ත්‍රාත්කරුවන්ගෙන් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද කළ අලාභ අයකර ගෙන නොතිබුණි.

**(iv) පලතුරු උයනේ මව් පැලැටිවල " (Orchard Mother Plant) " කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදය**

සමාලෝචිත වර්ෂය තුළ පලතුරු ගොවිපොළේ මව් පැලැටි වගා කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කර තිබූ අතර කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු.4,490,268 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේවුවද පස් රැඳවීම් වැඩ සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2015 අගෝස්තු 31 වන විටත් අරමුදල් ඵලදායීව උපයෝජනය කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **ගෙවීම් ස්වභාවය** | **මුදල** |
|---|---|
| | රු. |
| ජල ටැංකිය හා නළ ළිඳ ඉදිකිරීම. | 1,047,200 |
| දැල් නිවස ඉදිකිරීම. | 315,000 |
| පැලැටි මිලදී ගැනීම | 76,270 |
| කෘෂිකාර්මික උපකරණ (ජල පොම්පය, රෝද දෙකේ ට්‍රැක්ටරය, වැඩි පීඩිත ප්‍රධාන රැහැන, අඩු පීඩිත ප්‍රධාන රැහැන ආදී ) | 2,591,113 |
| විදුලි බල සම්බන්ධතාවය (මේ වන තුරුත් සම්බන්ධතාවය ලැබී නැත) | 460,685 |
| | 4,490,268 |

## 5.13 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

(i) යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 10 ක් විසින් වටිනාකම රු.109,518,500 ක් වූ ව්‍යාපෘති වැඩ 68 ක් අරමුදල් නොමැති වීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(ii) වටිනාකම රු.20,460,000 ක් වූ පහත සඳහන් ව්‍යාපෘති වැඩ 18 ක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය හා පෙර වර්ෂ තුළ ආරම්භ කර නොතිබුණි.

| මුදල් වර්ෂය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කිරීම | ලැබුණු අග්‍රිම තැන්පතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| 2013 | 03 | 7,810,000 | 7,810,000 |
| 2014 | 15 | 12,650,000 | 12,650,000 |
| | 18 | 20,460,000 | 20,460,000 |

## 5.14 උතුරු පළාතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිරීක්ෂණ

(i) පළාත් මාර්ග ව්‍යාපෘතිය පිළිබඳ භෞතික ප්‍රගතිය (PRP)

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, උතුරු පළාතේ දළ වශයෙන් කිලෝමීටර් 100 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණද, කිලෝමීටර් 56.17 ක දිගින් යුත් පළාත් මාර්ග 12 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් පැකේජ 04 ක් ප්‍රදානය කර තිබුණි. පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂිත පළාත් මාර්ග 12 ක් අතුරින් පැකේජ 02 ක් යටතේ කිලෝමීටර් 23.07 ක දිගින් යුත් මාර්ග 06 ක පුනරුත්ථාපන වැඩ 2013 ඔක්තෝබර් 30 දිනට, දින 150 සිට දින 174 දක්වා වූ කාල ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. කිලෝමීටර් 26.42 ක දිගින් යුත් වෙනත් මාර්ගවල පුනරුත්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි.

(ii) උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (NRCP) භෞතික ප්‍රගතිය

මුල් වැඩ විෂය පථය හා අතිරේක අරමුදල් වැඩ පිළිවෙල යටතේ සිදුකළ යුතු පුනරුත්ථාපන වැඩ සංරචක 02 ක් සහිතව ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත විය. මුල් වැඩ විෂය පථය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව කිලෝමීටර් 170 ක දිගින් යුත් උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 10 ක් නිම කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. එම මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 10 ක් ව්‍යාපෘතිය විසින් පිරිනමා තිබූ අතර 2013 දෙසැම්බර් 21 දිනට සියලු පුනරුත්ථාපන වැඩ මුළුමනින්ම නිමකර තිබුණි. කොන්ත්‍රාත් II අදියර යටතේ කාර්ය සාධනය පදනම් මාර්ග නඩත්තු කොන්ත්‍රාත්වලට එළඹීමට සහ එම මාර්ගවල මාර්ග නඩත්තු කාර්යයන් ඉදිරියට වර්ෂ 03 ක් සඳහා සිදු කිරීමට කොන්ත්‍රාත්කරුවන් වගකීමට බැඳී තිබුණි.

තවද උතුරු හා උතුරු මැද පළාත්වල වෙනත් මාර්ග 10 ක පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්තු අතිරේක මූල්‍යයන වැඩ පිළිවෙල යටතේ 2013 හා 2014 වර්ෂවල ලබා දී තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 30 සිට සියයට 75 දක්වා විය. ඉන් 2013 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 දිනට සියයට 30.7 ක අඩු භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි.

(iii) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා දේශීය මට්ටමේ පෝෂණ මැදිහත් වීම් ව්‍යාපෘතිය (JSDF)

(අ) භෞතික ප්‍රගතිය

උතුරු පළාතේ අවතැන් වූ ජනතාවගේ මන්දපෝෂණය අඩු කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉලක්කගත ගර්භණී කාන්තාවන් 9,000 ක්, කිරිදෙන මවුවරුන් 5,000 ක් හා වයස අවුරුදු 5 ට අඩු ළමුන් 11,000 ක් සඳහා පෝෂණ ආහාර (ජීවපෝෂ) සැපයීමට ව්‍යාපෘතිය සම්බන්ධ වී තිබූ අතර ගර්භණී කාන්තාවන් 6,084 කට, කිරිදෙන මවුවරුන් 5,404 කට හා ළදරුවන් හා ළමුන් 11,478 කට ව්‍යාපෘතිය යටතේ සේවා ලබා දී තිබුණි.

(ආ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදයේ අවසාන අදියරයන්හිදී වයස අවුරුදු 2 ට අඩු ළමුන් සඳහා පමණක් ආහාර සැපයීමට ව්‍යාපෘතිය තීරණය කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වයස අවුරුදු 2 සිට 5 අතර ළමුන් සඳහා ව්‍යාපෘතිය විසින් එම සේවා ලබා දී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මෝටර් වාහන හා ග්‍රයින්ඩර්ස් සහ මුද්‍රණ ද්‍රව්‍ය ආදිය ප්‍රසම්පාදනය කිරීමේ අරමුණ සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 16.08 ක මුදලක් වැය කර තිබූ බවත්, මෙම විෂයයන් මූලායන සැලැස්මේ ඇතුළත් කර නොතිබූ බවත්, ව්‍යාපෘතියේ අරමුණුවලට සෘජුවම අදාළ නොවූ බවත් නිරීක්ෂණය විය.

(iv) යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ඉරණමඩු සංරචකය)

(අ) භෞතික ප්‍රගතිය

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් වර්ෂ 3 ½ ක් ගත වී තිබුණද ව්‍යාපෘති ගිවිසුම අනුව වාන්මඟ, අරිය (Radial), ගේට්ටු, ඒප්‍රන්, ශක්තිය විසුරුවන ව්‍යුහයන්, පාලම, සොරොව් ගේට්ටු, තිරසාර ජලය වර්ධනය කිරීමට හා ඉඩම් ඵලදායිතාවය වැඩි කිරීමට ස්වයංක්‍රීය යන්ත්‍ර යොදා ගැනීම ඉටුකර ගැනීම ඇතුළත් ඉරණමඩු ප්‍රධාන වැඩ පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. ජලය බෙදා ගැනීම පිළිබඳව ප්‍රදේශයේ ගොවීන්ගෙන් වූ තදබල විරෝධය හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ නොකළ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මේ සම්බන්ධයෙන් සඳහන් කර තිබුණි. ව්‍යාපෘතියේ මුල් අදියරයන්හිදී ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ ගොවීන් සමඟ සාකච්ඡා කිරීමට ව්‍යාපෘතිය කටයුතු කළේ නම් ව්‍යාපෘතියේ පිරිවැය හා කාලය ඉතිරිකර විරෝධය ද අවම කර ගත හැකිව තිබුණු බව විගණනයේදී පෙනී යයි.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ දුරකථන, විදුලි ගාස්තු හා පාඨමාලා ගාස්තු මත දරන ලද එකතුව රු.135,977 ක් ව්‍යාපෘතියේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(v) උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන්ව නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතිය

(අ) භෞතික කාර්යසාධනය

(i) ව්‍යාපෘති පරිපාලන ලියවිල්ලේ 15 ඡේදය ප්‍රකාරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් සභාපතිත්වය දරන ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුව (PCC) මාසිකව පැවැත්විය යුතුය. කෙසේවුවද ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ කටයුතු ඵලදායීව නියාමනය කිරීමට හැකිවනු පිණිස ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

(ii) ඉටුකර ගත යුතු ඉලක්ක සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් හඳුනා ගැනීමට අවශ්‍ය වන ක්‍රියාකාරී සැලැස්මක් හා ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී සිදු කළ යුතු කාර්යයන්ට අදාළව අයවැය වෙන්කිරීම පිළියෙල කර නොතිබුණි. එබැවින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා හා සකස් කළ අරමුණු ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් වශයෙන් ඇගයීම් කිරීමට නොහැකි විය.

(iii) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, කුඹුරු වාරිමාර්ග ඇළවල් පුනරුත්ථාපනය කිරීම පිළිබඳව 2014 පෙබරවාරි 28 දිනට භෞතික ප්‍රගතිය පහත පරිදි වේ

| දිස්ත්‍රික්කය | කුඹුරු වාරිමාර්ග ඇළවල් (FICS) | | | |
|---|---|---|---|---|
| | ඉලක්කය | නිමකළ | කෙරීගෙන යන වැඩ | එකතුව |
| | කි.මී. | කි.මී. | කි.මී. | කි.මී. |
| යාපනය | 40 | 17.41 | - | 17.41 |
| කිලිනොච්චි | 40 | - | 22.5 | 22.5 |
| මුලතිව් | 40 | - | 7.25 | 7.25 |
| මන්නාරම | 40 | 18.90 | - | 18.90 |
| වවුනියා | 40 | - | 23.58 | 23.58 |
| එකතුව | 200 | 36.31 | 53.33 | 89.64 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී පුනරුත්ථාපනය කිරීම සඳහා ඉලක්ක කරන ලද කිලෝමීටර් 200 න් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී කුඹුරු වාරිමාර්ග ඇළවල් කිලෝමීටර් 36.31 ක් පමණක් නිම කර තිබුණි.

(iv) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 100 ක් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය ඉලක්ක කර තිබූ අතර ඉන් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 28.98 ක වැඩි දියුණු කිරීම් වැඩ පමණක් 2014 පෙබරවාරි 28 දිනට සම්පූර්ණ කර තිබුණි.

(v) ව්‍යාපෘති ගිවිසුම අනුව, අවම වශයෙන් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් 2000 ක් වෙනුවෙන් ස්වයං රැකියා සඳහා කුසලතා සංවර්ධන පුහුණුවක් ලබා දීමට අපේක්ෂා කර තිබූ අතර ඉන් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින් 1,758 ක් සඳහා පමණක් 2014 පෙබරවාරි 28 දිනට පුහුණු වැඩමුළු ලබා දී තිබුණි.

(අ) ව්‍යාපෘතිය විසින් මුලතිව්, කිලිනොච්චි, වවුනියා, මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කවල සිදු කරන ලද ජීවනෝපාය ප්‍රතිස්ථාපන කාර්යයන් යටතේ රු.29,377,755 ක් වටිනා මෙවලම් හා උපකරණ බෙදා දී තිබුණි. කෙසේ වුවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට පටහැනිව එම වත්කම් ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් තෝරා ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. තවද දිස්ත්‍රික් කාර්යාල 05 ක ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණය මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව පවත්වා නොතිබුණි. එබැවින් දිස්ත්‍රික් කාර්යාලවලට බෙදා දී තිබූ රු.5,100,789 ක් වටිනා ජංගම නොවන වත්කම් හා රු.29,377,755 ක් වටිනා මෙවලම් පිළිබඳ පැවැත්ම පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) උපදෙස් ලබා දී ඇති පරිදි, ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා බැංකු ශේෂයන් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද එකතුව රු.1,020,436 ක් වූ මුදල් හා බැංකු ශේෂ 2014 පෙබරවාරි 28 දිනට මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතිය විසින් 2014 පෙබරවාරි 28 දින රු.1,137,768 ක පිරිවැයකට ඩෙස්ක්ටොප් පරිගණක 10 ක් ප්‍රසම්පාදනය කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 වන විටත් එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ පරිශ්‍රයේ රඳවා ගෙන තිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ කාර්යයන් 2014 පෙබරවාරි 28 දිනට වසා දමා තිබුණද ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ වත්කම් අදාළ නියෝජිතායතනයන්ට භාරදීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපෘතිය වසා දැමීමේ ගිණුම්ද පිළියෙල කර නොතිබුණි.

(ඊ) සේවක භාරකාර අරමුදලට කරන ලද රු.343,035 ක වැඩිපුර ගෙවීම මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිත ගිණුම යටතේ දක්වා තිබුණි.

(vi) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP)

පළාත් පාලන ආයතනවල යටිතල සංවර්ධන කාර්යයන් සඳහා මුදා හරින ලද රු.2,240,764,419 ක් වූ ප්‍රදාන පළාත් පාලන ආයතන විසින් සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හෙළිදරව් කර තිබුණි.

## 5.15 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාවට අදාළ තොරතුරු පහත දැක්වේ.

(අ) පාසැල් හැර පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත ) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,675 | 1,122 | 553 |
| තෘතියික මට්ටම | 2,628 | 1,762 | 866 |
| ද්විතියික මට්ටම | 3,979 | 3,003 | 976 |
| ප්‍රාථමික මට්ටම | 5,904 | 5,609 | 295 |
| | 14,186 | 11,496 | 2,690 |

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු 2,690 ක් පිරවීම සඳහා පළාත් සභාව විසින් අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ii) පාසැල් කාර්ය මණ්ඩලය

| දිස්ත්‍රික්කය | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු | | අතිරික්තය | |
|---|---|---|---|---|---|---|---|---|
| | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් | ගුරුවරුන් |
| යාපනය | 498 | 6,701 | 334 | 7,003 | 164 | - | - | 302 |
| කිලිනොච්චි | 122 | 1,735 | 75 | 1,630 | 47 | 105 | - | - |
| මන්නාරම | 143 | 1,422 | 76 | 1,544 | 67 | - | - | 122 |
| වවුනියා | 235 | 2,030 | 169 | 1,998 | 66 | 72 | - | 40 |
| මුලතිව් | 130 | 1,561 | 81 | 1,472 | 49 | 89 | - | - |
| එකතුව | 1,128 | 13,449 | 735 | 13,647 | 393 | 266 | - | 464 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උද්‍යාන කම්කරුවන්, ගණිත සම්පත් මධ්‍යස්ථාන සඳහා කම්කරුවන් හා නිලධාරීන්, අභ්‍යන්තර සේවා උපදේශක, ගුරු මධ්‍යස්ථාන කළමනාකරු හා කාර්මික නිලධාරීන් සඳහා සේවක මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. කෙසේ වුවද සේවක සංඛ්‍යා අනුමැතියක් නොමැතිව එම සේවක වර්ගයන්ට අයත් 36 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ii) කාර්ය සාධන පදනම මත විදුහල්පතිවරුන් ලෙස ගුරුවරුන් 327 දෙනෙකු සේවය කර තිබුණි. මේ සම්බන්ධයෙන් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(iii) යාපනය, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කවල අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව වූ 464 න් කිලිනොච්චි, වවුනියා හා මුලතිව් දිස්ත්‍රික්කවල ගුරු පුරප්පාඩු 266 ක් පිරවීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(iv) දිස්ත්‍රික් පහක විදුහල්පති තනතුරු පුරප්පාඩු 393 ක් පිරවීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(iii) සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය**

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (PDHS) හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල (RDHS) සෞඛ්‍ය නිලධාරීන්ගේ අතිරික්ත හා පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද පළාත ඇතුළත අතිරික්ත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු කාර්ය මණ්ඩලය පුරවා තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | වෛද්‍ය නිලධාරී | | | දන්ත ශෛල්‍ය වෛද්‍ය නිලධාරී | | | හෙද සේවය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
| යාපනය | 220 | 131 | 89 | 37 | 26 | 11 | 289 | 166 | 123 |
| කිලිනොච්චි | 107 | 82 | 25 | 13 | 07 | 06 | 144 | 65 | 79 |
| මුලතිව් | 123 | 61 | 62 | 11 | 06 | 05 | 132 | 56 | 76 |
| වවුනියා | 149 | 107 | 42 | 14 | 15 | (01) | 262 | 206 | 56 |
| මන්නාරම | 124 | 74 | 50 | 17 | 14 | 03 | 151 | 107 | 44 |
| | 723 | 455 | 268 | 92 | 68 | 24 | 978 | 600 | 378 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමස්ත සෞඛ්‍ය සේවක කාර්ය මණ්ඩලය සඳහා 7,275 ක සංඛ්‍යාවක් සඳහා ඉල්ලීම් කර තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 6,325 ක සංඛ්‍යාවක් සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණි.

(ආ) විශේෂඥ වෛද්‍යවරුන් සඳහා අනුමත කාර්ය මණ්ඩලය වූ 119 ක සංඛ්‍යාවකින් දැනට පළාතේ විශේෂඥ වෛද්‍යවරුන් 43 ක් පමණක් සේවය කරනු ලැබේ. යාපනය හා මුලතිව් දිස්ත්‍රික්කවල රෝහල් කීපයක පුරප්පාඩු පවතී.

(ඇ) වෛද්‍ය නිලධාරීන් සඳහා 723 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් දැනට වෛද්‍ය නිලධාරීන් 455 ක් පමණක් සේවයේ යෙදී සිටින අතර ඒ හේතුවෙන් පර්යන්ත රෝහල් කිහිපයක් කිසිදු එම්බීබීඑස් වෛද්‍ය නිලධාරියකු නොමැතිව ක්‍රියාත්මක වේ.

(ඇ) ප්‍රධාන රෝහල්වල හෙද සේවයේ නිලධාරීන්ගේ විශාල හිඟයක් පවතී. පළාතේ 978 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් හෙද සේවා නිලධාරීන් 600 ක් පමණක් සේවයේ යෙදී සිටී.

(ඉ) දන්ත ශෛල්‍ය වෛද්‍ය තනතුරු සඳහා 92 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් දැනට වෛද්‍ය නිලධාරීන් 68 ක් පමණක් සේවය කරන අතර දිස්ත්‍රික්ක 5 ක පුරප්පාඩු 24 ක් මේ දක්වා පුරවා නොතිබුණි.

(ඊ) අතුරු වෛද්‍ය සේවා නිලධාරීන් 287 ක සංඛ්‍යාවක හිඟයක්ද උතුරු පළාතේ පවතී.

**(iv) අවිධිමත් පත්කිරීම් හා පාරිශ්‍රමික ගෙවීම**

කිසිදු විධිමත් බඳවා ගැනීම් පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව පළාත් සභාවේ බඳවා ගැනීම් බොහොමයක් තත් කාර්ය පදනම මත සිදුකර තිබූ අතර, දීප ව්‍යාප්ත සේවා හෝ පළාත් රාජ්‍ය සේවා වලට අදාළවන අනුමත බඳවා ගැනීම් යෝජනා ක්‍රමය පිළිබඳ විෂය පථය ඇතුළත සමහර පත්කිරීම් සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 මැයි 11 දිනැති අංක 9 /2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නැවත පත්කරන ලද විශ්‍රාමික නිලධාරීන්ට වැටුප් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් රු. මිලියන 3.3 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද 2011 වර්ෂය සඳහා මාගේ වාර්තාවෙන් මෙම කරුණ පෙන්වා දී තිබුණද, 2011 වර්ෂයේදී කරන ලද රු.3,360,959 ක වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නීති උපදේශක ඇතුළත් කොන්ත්‍රාත් පදනම මත වූ සේවකයන් නව දෙනෙකුට පත්වීම් ලිපි නිකුත් කර තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීමක් පළකිරීම සිදු කිරීමෙන් තොරව විශ්‍රාමික නිලධාරීන් නැවත පත්කර තිබුණි.

(ඇ) වැඩි පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරුන් පළාතේ සිටියද, බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අඩු පළපුරුද්දක් සහිත ගණකාධිකාරීවරුන් ප්‍රධාන ගණකාධිකාරීවරුන් ලෙස පත්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස යහපත් මූල්‍ය පාලනයක් හා මූල්‍ය විනයක් එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ක්‍රියාත්මක කළ නොහැකි විය.

(ඉ) බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කළමනාකරණ සේවයේ I පන්තියේ නිලධාරීන් වෙනුවට කළමනාකරණ සේවයේ III පන්තියට අයත් නිලධාරීන් ප්‍රධාන කළමනාකරණ ලිපිකරුවන් ලෙස පත්කර තිබුණි.

(ඊ) බොහෝ කළමනාකරණ සහකාරවරුන්ට වැඩසටහන් සහකාරවරුන්ගේ රාජකාරි සිදු කිරීම සඳහා පවරා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය දීප ව්‍යාප්ත සේවාවක් වුවද, 2007 පෙබරවාරි 11 දිනැති අංක එස්සීඑෆ්ආර්320/2003 දරන නඩුව සම්බන්ධයෙන් දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සැලකිල්ලට ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ගණකාධිකාරී තනතුරුවල රාජකාරි සිදු කිරීම සඳහා ඇතැම් නිලධාරීන් පත්කර තිබුණි.

(ඌ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද අවිධිමත් පත්කිරීම

-----------------------------------------------------------------

උතුරු පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවිධිමත් පත්කිරීම් හා යළි සේවයේ පිහිටුවීම් සිදු කර තිබූ අතර ඉහත සඳහන් නිලධාරීන් සඳහා රු.428,482 ක වැටුප් ගෙවීම්ද සිදු කර තිබුණි.

**(v) ගුරුවරුන් යෙදවීම**

---------------------

එක් එක් විශේෂිත විෂයයන් සඳහා පාසැල්වල තිබෙන පුරප්පාඩුවලට අනුව ගුරුවරුන් විධිමත්ව යොදවා නොතිබුණි. ඒ හේතුවෙන් අදාළ විෂයයන් සඳහා සමහර පාසැල්වල ගුරු පුරප්පාඩු නිරීක්ෂණය වූ අතර එම විෂයයන් සඳහා සමහර පාසැල්වල ගුරු අතිරික්තයන් නිරීක්ෂණය විය. ගුරුවරුන් අවිධිමත්ව යෙදවීම හේතුවෙන්, අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගවල කාර්ය සාධනය ඉටු කරගෙන නොතිබුණි. විෂයයන් සඳහා තිබූ පුරප්පාඩුවලට අනුව, ගුරුවරුන් විධිමත්ව යෙදවූයේ නම් උසස් කාර්ය සාධනයක් ඉටුකරගත හැකිව තිබුණි.

## 5.16 මෝටර් වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් සභාවට මෝටර් වාහන 1,094 ක සංඛ්‍යාවක් අනුයුක්ත කර තිබුණි. පළාත් මූල්‍ය රීති - 433 ප්‍රකාරව පළාත් සභාවේ දෙපාර්තමේන්තු කිහිපයක් විසින් ඔවුන්ගේ නිල වාහන වලට අදාළ දෛනික ධාවන වාර්තා හා මාසික කාර්ය සාධන සාරාංශ සමාලෝචිත වර්ෂයේ නියමිත දිනයන් තුළ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, උතුරු පළාත් සභාවට අනුයුක්ත වාහන 1094 කින් වාහන 30 ක ලියාපදිංචි අයිතිකරුවන්ගේ නම් නොදැන සිටි අතර වාහන 511 ක් උතුරු පළාත් සභාවේ නම යටතේ නොවීය.

(iii) මන්නාරම, වවුනියා, කිලිනොච්චි හා මුලතිව් පළාත් සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් විසින් වාහන බොහොමයක් අලුත්වැඩියා සඳහා වර්ෂ 1 සිට 5 දක්වා පරාසයක කාලයක් ගරාජ් වලට භාර දී තිබුණි.

(iv) පළාත් මුදල් රීති 433 ප්‍රකාරව සමහර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් දෛනික ධාවන සටහන් වාර්තා විධිමත්ව පවත්වා නොතිබුණු අතර, බැහැරයාම පිළිබඳ අරමුණ දෛනික ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

(v) විවිධ පාර්ශ්වයන් විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් දිස්ත්‍රික්ක දෙකක පළාත් පාලන ආයතනවල වාහන 92 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

| දිස්ත්‍රික්කය | වාහන සංඛ්‍යාව |
|---|---|
| යාපනය | 87 |
| මුලතිව් | 05 |
| | 92 |

(vi) වාහන අලුත්වැඩියාව - රු. 5,778,011

---

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010 මැයි 14 දිනැති අංක සීජ් /1/17/1 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අනුයුක්ත කළ යුතු උපරිම වාහන සංඛ්‍යාව 07 කි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට වාහන 20 කට වැඩි සංඛ්‍යාවක් අනුයුක්ත කර තිබුණි. තවද රු.5,778,011 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ වාහන 11 ක් අලුත්වැඩියා කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව වාහන අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශය (9.3 ට යොමුව) ප්‍රකාරව රු.200,000 කට වැඩි වියදම් දැරීම සඳහා අනුමැතීන් අදාළ අධිකාරීන්ගෙන් ලබාගෙන නොතිබුණි.

(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව අලුත්වැඩියා සඳහා ගෙවීම් කිරීමට ප්‍රථම යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගෙන් සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) පළාත් මුදල් රීති 107 ට පටහැනිව අවස්ථා 03 කදී මුල් ඉන්වොයිසි ලබා ගැනීමෙන් තොරව වාහන අලුත්වැඩියා සඳහා ගෙවීම් කර තිබුණි.

(ඉ) රු.88,954 සිට රු.1,997,696 දක්වා වූ පිරිවැයකට නව වාහන 11 ක් සඳහා විශාල අලුත්වැඩියාවන් සිදුකර තිබුණි.

**(viii)** **අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාළව ධාවන වාර්තාවල ගමනේ ස්වභාවය දක්වා නොතිබූ අතර වාහනය පාවිච්චි කරන ලද නිලධාරියා විසින් ධාවන වාර්තාවල අත්සන්ද යොදා නොතිබුණි. විස්තර පහත දැක්වේ.**

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | වාහන අංකය | ගමනේ අරමුණ දක්වා නොමැති | වාහනය භාවිතා කරන ලද නිලධාරියා විසින් අත්සන් කර නොමැති |
|---|---|---|---|
| | | (කි.මී) | (කි.මී) |
| ධීවර අමාත්‍යාංශය | NA 5505 | | 864 |
| | NA 7589 | | 84 |
| | HL 8553 | 30,700 | |
| | NA 4760 | | 258 |
| | NA 7588 | | 69 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | NPPF 2048 | 23,181 | |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | EPJN 9283 | 16,096 | 72 |
| | NPPC 1494 | 34,704 | 24 |
| ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය | JO 8604 | 33,450 | |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | NA 4723 | 20,407 | 448 |
| | HL 8546 | 29,274 | |
| | WI 5387 | 9,322 | |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | WPPB 7081 | 28,194 | 956 |
| | NPJW 1153 | 45,428 | 1,587 |
| | EPQN 0251 | 2,146 | |
| | NPLW 0561 | 18,893 | |
| | EPNA 6803 | 34,796 | 38 |
| දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව | EPPP 0590 | 24,217 | |
| | EPPB 7418 | 40,604 | |
| කර්මාන්ත දෙපාර්තමේන්තුව | NPPF 2048 | 6,567 | |
| පළාත් පාලන අමාත්‍යාංශය | NA 7531 | 30,585 | 45 |
| මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | EPHM 2817 | 21,129 | |
| අභ්‍යන්තර විගණන අංශය | 227 – 5953 | 9,822 | |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 32 – 7380 | 12,984 | |
| | | 472,499 | 4,455 |

## 5.17 බැංකු සැසඳුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිකුත් කරන ලද නමුත් මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.39,796 ක් වටිනා චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 6 ක් පළාත් මුදල් රීති 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) එක් අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තු 04 ක එකතුව රු.227,492 ක් වූ හඳුනා නොගත් ලැබීම් නිරීක්ෂණය විය. මෙම ලැබීම් හඳුනාගෙන අදාළ ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.18 පළාත් පාලන ආයතන කටයුතු පිළිබඳ අධීක්ෂණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 8 වන උපලේඛනයේ 4.2 වගන්තියේ ඇතුළත් විධිවිධානවලට අනුව, පළාත් පාලන ආයතන පිළිබඳ අධීක්ෂණය පළාත් සභාවට පවරා තිබුණි. පළාත් පාලන ආයතනවලට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 න් පළාත් පාලන ආයතන 23 ක් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් 2015 මාර්තු 31 ට පෙර විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළ උතුරු පළාතේ පළාත් පාලන ආයතනවල වාර්ෂික ගිණුම් 11 ක් 2015 අප්‍රේල් 01 සිට 2015 සැප්තැම්බර් 21 දක්වා ඉදිරිපත් කර තිබුණි.

(ii) පළාත් පාලන ආයතනවල අවසන් ගිණුම් පිළිබඳව තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද අවස්ථා පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද අවස්ථා ගණන |
|---|---|
| යාපනය | 17 |
| මුලතිව් | 04 |
| කිලිනොච්චි | 03 |
| වවුනියා | 05 |
| මන්නාරම | 05 |
| | 34 |

(iii) පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු

(අ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ විමර්ශන නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(ඇ) පාලන ගිණුම්වල ශේෂ, උපයෝගී ලේඛන හෝ වාර්තාවල දැක්වෙන ශේෂ සමඟ ගැලපී නොතිබුණි.

(ඈ) නිල වාහන භාවිතා කිරීමට හිමිකම් නොමැති පළාත් පාලන ආයතන කිහිපයක මන්ත්‍රීවරුන් නිල වාහන භාවිතා කර තිබුණි.

(ඉ) ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ බැවින් පළාත් පාලන ආයතනවල ඉඩම් හා ගොඩනැගිලි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) වර්ෂ 25 කට වැඩි කාලයක් දේපල තක්සේරු කර නොතිබීම හේතුවෙන් වරිපනම් හා බදු ආදායම වැඩි කර ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) ප්‍රාදේශීය සභා සතු ඉඩම් කිහිපයක් උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් බස් නැවතුම්පොළවල් සඳහා යොදා ගෙන තිබුණද , උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයෙන් කිසිදු අයකිරීමක් සිදුකර නොතිබුණි.

(ඌ) යාපනය මහ නගර සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පත්කිරීම් කර තිබුණු අතර එම තත්කාර්ය කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ලෙස රු.17,453,550 ක මුදලක් ගෙවා තිබුණි.

(එ) පළාත් පාලන සේවාවන් විසින් කරන ලද රු.137,776,442 ක විශ්‍රාම වැටුප් දායකය යාපනය හා මන්නාරම දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පළාත් සභාව, පළාත් අමාත්‍යාංශ 5 ක් හා පළාත් දෙපාර්තමේන්තු 31 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මුදල් රීති 99 ප්‍රකාරව, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කිරීමේදී පළාත් මුදල් රීති 101 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගෙන නොතිබුණි.

(ඇ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද විවිධ කරුණු සම්බන්ධයෙන් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 6.3 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වාරයක් හෝ රැස්විය යුතුය. කෙසේ වුවද දෙපාර්තමේන්තු කිහිපයක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් හෝ පවත්වා නොතිබුණි.

## 6.4 උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2006 දෙසැම්බර් 22 දින දෙන ලද නියෝගය පදනම් කරගෙන එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කරන ලදී. කෙසේ වුවද, වෙන් කිරීම පිළිබඳව හා උතුරු පළාත් සභාව පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රසිද්ධ කර නොතිබුණි. එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කර වර්ෂ 7 ක් සම්පූර්ණ වීමෙන් පසුව, පත් වූ උතුරු පළාත් සභාව 2013 ඔක්තෝබර් 25 දින පිහිටුවා තිබුණි.

## 6.5 ප්‍රසම්පාදන සැලැස්ම

(i) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2014 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදනයන්හි පොදු අඩුපාඩු

(අ) රු.856,800 කට ආදායම් බලපත්‍ර ආකෘති මුද්‍රණය සඳහා ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මිල සැඳහුම් 5 කට අඩු සංඛ්‍යාවක් පදනම් කරගෙන රු.856,800 ක පිරිවැයකට ආදායම් බලපත්‍ර ආකෘතිපත්‍ර 300,000 ක සංඛ්‍යාවක් ප්‍රසම්පාදනය කර තිබුණි. තවද ඉහත ආකෘති මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලයාධිපති වෙනුවට පුද්ගලික මුද්‍රණ ආයතනවලට ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) රු.1,026,820 කට ත්‍රී රෝද රථ 02 ක් ප්‍රසම්පාදනය කිරීම

සමාලෝචිත වර්ෂය තුළ ත්‍රී රෝද රථ 02 ක් මිලදී ගැනීම සඳහා ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් රු.1,026,820 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ඇස්තමේන්තුවේ අයවැය ප්‍රතිපාදන නොමැති හෙයින් පරිපූරක ප්‍රතිපාදන මඟින් මෙම ගෙවීම කර තිබුණි.

(ii) ත්‍රී රෝද රථවල අවශ්‍යතාවය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වාහන අලුත්වැඩියාව- රු.2,984,203

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව, මිල සැඳහුම් 5කට අඩු සංඛ්‍යාවක් පදනම් කරගෙන රු.2,532,803 ක වටිනාකමට ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් වාහන 05 ක් අලුත්වැඩියා කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව මිල සැඳහුම් 5 කට අඩු සංඛ්‍යාවක් පදනම් කරගෙන රු.451,400 ක වටිනාකමට පළාත් අභ්‍යන්තර විගණන ඒකකය විසින් වාහනයක් අලුත්වැඩියා කර තිබුණි.

(ඈ) රු.598,800 කට ඩෙස්ක්ටොප් පරිගණක සෙට් ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව මිල සැඳහුම් 5 කට අඩු සංඛ්‍යාවක් පදනම් කරගෙන ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් රු.598,800 කට ඩෙස්ක්ටොප් පරිගණක සෙට් මිලදී ගෙන තිබුණි.

**6.6 පළාත් සභාව හා පළාත් පාලන ආයතන විසින් වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම**

(i) 2004 පෙබරවාරි 4 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව උතුරු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 34 ක වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

## 6.7 අයවැය පාලනය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (3) (ආ) වගන්තිය ප්‍රකාරව සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වැය ශීර්ෂ 28 ක් යටතේ රු.3,544,510,044 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන 110 ක් මගින් අරමුදල් මාරුකර ගෙන තිබුණි. තවද අයවැය ලේඛනය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

## 6.8 වාර්ෂික වාර්තා විගණකාධිපතිවරයාගේ වාර්තා සමඟ පළාත් සභාවේ සභාගත කිරීම

පත්වූ උතුරු පළාත් සභාව 2013 ඔක්තෝබර් 25 දින ස්ථාපිත කර තිබුණද 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාරව 2007 සිට 2013 දක්වා වූ වර්ෂ සඳහා (වර්ෂ 7 ක්) උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා 2015 අගෝස්තු 31 දින දක්වා පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2007 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තාවල පෙන්වා තිබූ කරුණු නිවැරදි කර ගැනීමට පළාත් සභාව විසින් කිසිදු යාන්ත්‍රණයක් අනුගමනය කර නොතිබුණි.

## 6.9 නිරවුල් නොකරන ලද විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

(i) පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් වාර්තා කරන ලද නිරවුල් නොවූ කරුණු

ඉකුත් වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රසම්පාදනයන් මත පෙන්වා දී ඇති අක්‍රමිකතා නිවැරදි කර ගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) රු.9,100,000 කට ලැප්ටොප් 100 ක් මිලදී ගැනීම.

(ආ) රු.6,145,688 කට පුද්ගලික ආයතනයක් සඳහා වායු සමීකරණ සවිකිරීම (වීරසිංහම් ශාලාව)

(ඇ) රු.8,575,000 කට ට්‍රැක්ටර් ටිපර් ට්‍රේලර් 15 ක් හා බවුසර් 20 ක් ප්‍රසම්පාදනය කිරීම .

(ඈ) නවීන ටොයෝටා මෝටර් රථයක් ප්‍රසම්පාදනය කිරීම - රු.9,950,000

(ඉ) රු.8,859,500 කට පාපැදි 700 ක් මිලදී ගැනීම.

(ඊ) රු.32,200,000 කට බස් රථ 10 ක් ප්‍රසම්පාදනය කිරීම.

(උ) නිවාස ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීම. - රු.59,400,000

(ඌ) ගැල්වනයිස් අයර්න් රූෆින් ෂීට්ස් ප්‍රසම්පාදනය. - රු.18,400,800

(එ) ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම. - රු.7,006,430

(ඒ) නැවත පදිංචි කළ පවුල් සඳහා ජල ටැංකි (ලීටර් 1000) 70 ක් ප්‍රසම්පාදනය කිරීම රු.894,000

(ඔ) යාපනය දිස්ත්‍රික්කය සඳහා 8’X6’ ප්‍රමාණයේ දැන්වීම් පුවරු 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.865,000

(ඕ) උපාංග සහිතව ජල නළ 200 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.6,580,000

(ක) නැවත පදිංචි කළ ගොවීන් සඳහා කෘෂි අත් පොත් මුද්‍රණය කිරීම- රු.1,152,000

(ග) ටොප් ලැන්ඩ් හෙවි ඩියුටි ඩීසල් පොම්ප 05 ක් සහ උපාංග ප්‍රසම්පාදනය - රු.4,755,000

(ජ) කොම්බයින් හාවස්ටර්ස් (4LZ-2-0 මොඩලය) 10 ක් ප්‍රසම්පාදනය කිරීම රු.15,300,000

(ට) 100 KVA ජෙනරේටර් ප්‍රසම්පාදනය - රු.2,647,128

(ඩ) පැරණි උද්‍යාන සංවර්ධනය සඳහා වියදම - රු.10,857,486

(ණ) ගැල්වනයිස් අයර්න් රූෆින් ෂීට්ස් ප්‍රසම්පාදනය - රු.11,880,000

(ත) ශීතන් රථ 08 ක් ප්‍රසම්පාදනය - රු.42,000,000

(ද) ට්‍රැක්ටර් 10 ක් හා ට්‍රේලර් 05 ක් ප්‍රසම්පාදනය - රු.13,115,000

(න) ජල බවුසර් 15 ක් පොම්ප සමඟ ප්‍රසම්පාදනය රු.4,425,000

(ප) පරිගණක හා ඡායා පිටපත් යන්ත්‍ර ප්‍රසම්පාදනය - රු.7,706,150

(බ) යාපනය දිස්ත්‍රික්කය සඳහා 8’X6’ ප්‍රමාණයේ දැන්වීම් පුවරු (Hoardings ) 111 ක සංඛ්‍යාවක් ප්‍රසම්පාදනය කිරීම - රු.10,010,900

(ම) ආදායම් බලපත්‍ර ආකෘති මුද්‍රණය කිරීම - රු.794,082

(ය) ගැල්වනයිස් අයර්න් රූෆින් ෂීට්ස් ප්‍රසම්පාදනය - රු.38,273,000

(ර) පාපැදි ප්‍රසම්පාදනය රු.10,528,400

(ල) සිමෙන්ති මළු ප්‍රසම්පාදනය රු.2,205,000

(ව) වාහන අලුත්වැඩියාව රු.3,992,898

(ස) පරිගණක සෙට්, ලැප්ටොප්, ප්‍රින්ටර්ස් ආදිය ප්‍රසම්පාදනය - රු.2,012,580

(හ) පළාත් ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහණ මැෂින් සැපයීම.

(ii) යළි සේවයේ පිහිටුවන ලද නිලධාරීන් සඳහා වැඩිපුර වැටුප් ගෙවීම - රු.3,360,950

(iii) ප්‍රාදේශීය රෝහල හා වෛද්‍ය නිලධාරී (MOH) සඳහා කාර්යාලයක් ඉදිකිරීමට අතිරේක ඉඩමක් අත්පත් කර ගැනීම - රු.මිලියන 3.75

2010 අගෝස්තු 7 දින මහජනයා විසින් පරිත්‍යාග කරන ලද අක්කර 5 ක ඉඩමක් ඒ වන විටත් දෙපාර්තමේන්තුව සතුව තිබියදී පුනාකරිහි වෛද්‍ය නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අක්කර 15 ක ඉඩමක් අත්කර ගැනීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2011 දෙසැම්බර් 31 දින රු. මිලියන 3.75 ක මුදලක් ගෙවා තිබුණි. අත්පත් කර ගැනීම අවස්ථාවේදී අක්කරයකට වෙළඳ පොළ අගය රු.200,000 ක් පමණක් වූ බැවින් රු.750,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ගෙවීම සිදු කිරීමට පෙර තක්සේරු වාර්තා ලබා ගෙන නොතිබුණි.තවද එම ගොඩනැගිල්ල අක්කරයකට අඩු ඉඩම් ප්‍රමාණයක් භාවිතා කර ඉදිකර තිබූ බව ද නිරීක්ෂණය විය.

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සිදුකර ඇති බවත් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්ගේ තැන්පතු ගිණුමේ තැබීම සඳහා රු.3,750,000 ක් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්ට ගෙවා ඇති බවත්, අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 8 වගන්තිය ප්‍රකාරව දැනට සම්පූර්ණ කර ඇති බවත්, අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීමෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පුනාකරි ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවීම මුදාහරින බවත්, අපගේ මුල් තීරණය පරිදි අක්කර 15 ක ඉඩමේ පුනාකරී දිස්ත්‍රික් රෝහල හා පුනාකරී වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීම සඳහා යොදා ගන්නා බවත්, ඉතිරි ඉඩම් ප්‍රමාණය වෛද්‍ය හා හෙද නිල නිවාස ආදිය ඉදිකිරීම සඳහා යොදා ගන්නා බවත් මේ සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

(iv) රු.210,240 ක වැඩිපුර ගෙවීම

(අ) කිලිනොච්චි, ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලයේ පන්ති කාමර ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයන්ට වඩා ගොඩනැගිලි ද්‍රව්‍ය වැඩිපුර ප්‍රමාණයන් මිලදී ගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.210,240 ක වැඩිපුර ගෙවීම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කිලිනොච්චි, ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලයේ පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී කිලිනොච්චි කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කරන ලද කාර්මික නිලධාරියාට අධීක්ෂණ ගාස්තු ලෙස රු.99,747 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද සිදුකරන ලද අධීක්ෂණ වැඩ සම්බන්ධයෙන් වැඩ නිම කිරීම තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2013 මැයි 22 දිනැති අංක 23 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව කිලිනොච්චි ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලය විසින් සිසුන්ගෙන් ඇතුළත්වීමේ ගාස්තු ලෙස රු.1,075,850 ක මුදලක් එකතු කරගෙන තිබුණි.

(v) පාසැල් සිසුන් 240 කගෙන් එකතු කරන ලද ඇතුළත් වීමේ ගාස්තු රු. මිලියන 2.4 ක් පිළිබඳ සාවද්‍ය පරිහරණය

---

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට පටහැනිව 2013 වර්ෂය තුළ යා/ හින්දු ප්‍රාථමික පාසැලේ සිසුන් 240 ක ගෙන් රු.මිලියන 2.4 ක මුදලක් එකතු කරගෙන තිබුණි. රු. මිලියන 2.4 ක එකතු කර ගන්නා ලද මුදල් පාසැල විසින් පවත්වා ගෙන යන බැංකු ගිණුමට හෝ පාසැල් සංවර්ධන සමිතියට ගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. එකතු කරගත් මුදලින් දරන ලද කිසිදු වියදමක් පිළිබඳ සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එකතු කර ගත් රු. මිලියන 2.4 ක මුදල සාවද්‍ය ලෙස පරිහරණය වී තිබුණි.

## 6.10 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

(i) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 කින් එකතු කරගන්නා ලද කසළ, කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් තොරව පුළුස්සා හෝ ඉඩම්වල වළ දැමීම මගින් විනාශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් චාවාකච්චේරි නගර සභාව විසින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. මිලියන 3.2 ක් වැය කර තිබූ අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා මායිම් තාප්පයක්ද ඉදිකිරීමට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 4.73 ක් වැයකර තිබුණි. මෙම වත්කම් අරමුණු කළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.

(ii) වුන්නාකම් විදුලි බල මධ්‍යස්ථාන ප්‍රදේශයේ පානීය ජලය දූෂණය වීම.

වුන්නාකම් ජලය තුළුමුව (Water intake) බිම් ප්‍රදේශය වුන්නාකම් පොසිල ඉන්ධන විදුලිබල මධ්‍යස්ථානයට ඉතා ආසන්නව පිහිටා තිබෙන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් (ජාජසජම) වුන්නාකම් ජලය තුළුමුව බිම් ප්‍රදේශයේ 2012 වර්ෂයේ දී තිබූ ඉන්ධන ආඝ්‍රාණයක් පිළිබඳ අවධානය යොමු කර තිබුණි.

වුන්නාකම් විදුලි බල මධ්‍යස්ථානය අවට උඩුවිල් හා කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ළිං 100 ක් පමණ 2013 නොවැම්බර් මාසයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විශ්ලේෂණය කරන ලද අතර එහිදී සියයට 80 ක පමණ ළිං ප්‍රමාණයක් අපවිත්‍ර තෙල් මිග්‍රෑ/ ලි. සියයට 0.33 සිට සියයට 19.40 දක්වා ප්‍රමාණයකින් දූෂණය වී තිබූ බව සොයා ගන්නා ලදී. ( ශ්‍රීලංප්‍ර සීමාව 0.2 මි. ග්‍රෑ / ලී .1-0-මි.ග්‍රෑ /ලී ) තවද ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලය (වුන්නාකම්) විසින්ද ළිං 16 ක් පරීක්ෂා කර තිබුණු අතර තෙල් ග්‍රීස් වලින් ප්‍රදේශය දූෂණය වී තිබූ බව එම වාර්තාවලින් ද දක්වා තිබුණි.

එම විශ්ලේෂණයෙන් වූ ප්‍රතිඵල පහත පරිදි වේ.

* මුළු ළිං 150 ක් විශ්ලේෂණය කර තිබුණි.
* ළිං 109 ක් (සියයට 73 ක්) ප්‍රමිත මට්ටමට වඩා ඉහළ තෙල් මට්ටමක් දක්වා තිබුණි. ළිං 7 ක් (සියයට 4 ක්) සීමාවට වඩා අඩු වූ අතර ළිං 34 ක් (සියයට 23 ක්) තෙල් හා ග්‍රීස් වලින් දූෂණය වී නොතිබුණි.
* තෙල් හා ග්‍රීස් වලින් දූෂණය වීම විදුලි බල මධ්‍යසථානය අවට කි.මී.1.5 ක ප්‍රදේශය ඇතුළත නිරීක්ෂණය විය.
* වුන්නාකම් විදුලි බල මධ්‍යස්ථානය අවට ඉහළ තෙල් හා ග්‍රීස් තට්ටු නිරීක්ෂණය විය.
* තෙල් පැතිරයාමේ ආකාරය උතුරු පෙදෙසට බව නිරීක්ෂණය වූ අතර එය කි.මී.1.50 සිට කි.මී. 2.0 දක්වා විය. තෙල් දූෂණය තවදුරටත් උතුරට පැතිරී තිබුණු අතර අනිත් පැතිවල පැතිරීම කි. මී/1.5 ට අඩු විය.

මේ සම්බන්ධයෙන් උතුරු පළාතේ පානීය ජල ගැටලුවට වන අයහපත් බලපෑම නිරාකරණය කර ගැනීම සඳහා පළාත් සභාව විසින් වර්ෂ 3 කට වැඩි කාලයක් කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(i) කාර්ය මණ්ඩලය පරිපාලනය

(ii) ආදායම් පරිපාලනය

(iii) කොන්ත්‍රාත් පරිපාලනය

(iv) මෝටර් වාහන උපයෝජනය

(v) ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය

(vi) ගිණුම්කරණය

(vii) අභ්‍යන්තර විගණනය